# කාර්යසාධන වාර්තාව - 2016

සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 1. | ආයතනික ව්‍යුහය | |
| 1.1 | දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර | 2 |
| 1.2 | හැඳින්වීම | 3 |
| 1.3 | දෙපාර්තමේන්තුවේ කාර්යයන් | 4 |
| 1.4 | සංවිධාන සටහන | 5 |
| 2. | 2016 වර්ෂයේ කාර්යසාධනය | |
| 2.1 | සමාලෝචනය | 6 - 7 |
| 2.2 | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය | 7 - 10 |
| 2.3 | ක්ෂුද්‍රමූල්‍යනය | 10 - 12 |
| 2.4 | කෘෂිකාර්මික ක්ෂේත්‍රය නගා සිටුවීම. | 12 - 17 |
| 2.5 | කුඩා පරිමාණ වැවිලි කර්මාන්ත අංශය සඳහා දක්වන ලද සහාය | 18 - 20 |
| 2.6 | ආහාර සුරක්ෂිතතාවය | 20 - 25 |
| 2.7 | අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම. | 25 - 26 |
| 2.8 | සත්ත්ව නිෂ්පාදන අංශයේ සංවර්ධනය | 26 - 29 |
| 2.9 | අත්‍යවශ්‍ය බෝග සංවර්ධනය සඳහා සහාය ලබා දීම. | 29 - 31 |
| 2.10 | ඉලක්කගත කණ්ඩායම් සඳහා වූ විශේෂ දිරි දීමනා | 31 - 32 |
| 3. | පරිපාලන හා මූල්‍ය කාර්යසාධනය | |
| 3.1 | පරිපාලන අංශය | 33 - 37 |
| 3.2 | මූල්‍ය අංශය | 38 - 39 |
| 3.3 | විගණන විමසුම් | 40 |

# 1. ආයතනික ව්‍යුහය

## 1.1. දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර

**දැක්ම**

*"සංවර්ධන මූල්‍ය සඳහා අවශ්‍ය පහසුකම් සපයන රජයේ ප්‍රධාන නියෝජිත ආයතනය බවට පත්වීම"*

**මෙහෙවර**

*"අදාළ පාර්ශවයන්ගේ මැදිහත්වීම ඇතිව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් යෙදවීම හා ප්‍රාථමික ව්‍යවසාය අංශය මූල්‍යනය හා ඊට අදාළ ප්‍රතිපත්ති හා ක්‍රමෝපායන් සැකසීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම"*

## 1.2 හැඳින්වීම

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය හා ක්ෂුද්‍රමූල්‍ය අංශය නගා සිටුවීමේ අරමුණ පෙරදැරිකර ගනිමින් 2005 ජනවාරි මස 01 වන දින මෙම දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. නිලධාරීන් 12 දෙනෙකු ප්‍රමුඛ 31 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයකින් සමන්විත මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් අංශ හතරක් යටතේ පහත පරිදි දැක්විය හැක.

### 1.2.1. ප්‍රාථමික සංවර්ධන අංශය

රජයේ සංවර්ධන සහනාධාර ක්‍රම ක්‍රියාත්මක කිරීම, ප්‍රාථමික ආර්ථික සංවර්ධනය නංවාලීම, නැගී එන ආර්ථික කටයුතු සම්බන්ධ ප්‍රතිපත්ති සකස් කිරීම යනාදී නියාමන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

### 1.2.2. ක්ෂුද්‍රමූල්‍ය සංවර්ධන අංශය

දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා ලොව පුරා පිළිගත් ක්‍රමවේදයක් වූ ක්ෂුද්‍රමූල්‍යනය පසුගිය දශක කිහිපය පුරා ලංකාව තුළ ද ක්‍රියාත්මක කර ඇත. ශ්‍රී ලංකාවේ පුළුල් භූගෝලීය ප්‍රදේශයක් පුරා ක්ෂුද්‍රමූල්‍ය සේවාවන් ව්‍යාප්තව පැවතුන ද ග්‍රාමීය ප්‍රදේශවල වාණිජ බැංකු හා රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු පෞද්ගලික අංශයේ ක්‍රියාකාරීත්වය අවම මට්ටමක පවතී. ක්ෂුද්‍රමූල්‍යනය, මධ්‍යම ආදායම් ලාභී කුටුම්භයන් හි ආදායම් හා වත්කම් වැඩි දියුණු කිරීමටත්, අඩු ආදායම් ලාභී කුටුම්භයන් හි පරිභෝජන වියදම් වැඩි කිරීමටත්, ඔවුන්ගේ ඉතිරි කිරීමේ පුරුද්ද වර්ධනය කිරීමටත්, සියළුම ආදායම් කාණ්ඩයන්හි පරිභෝජනය සුමට කිරීමේ මෙවලමක් ලෙසත්, කාන්තාවන්ගේ සාමාජීය හා ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීමටත් දායක වී ඇත.

### 1.2.3. සුළු හා මධ්‍ය පරිමාණ සංවර්ධන අංශය

ශ්‍රී ලංකා රජයේ සමස්ත ප්‍රතිපත්ති රාමුව තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසාය අංශය වැදගත් උපායමාර්ගික අංශය ලෙස හඳුනාගෙන ඇත. එම අංශය මඟින් ආර්ථික වර්ධනය, ප්‍රාදේශීය සංවර්ධනය, රැකියා අවස්ථා උත්පාදනය හා දරිද්‍රතාවය තුරන් කිරීමට විශාල දායකත්වයක් ලබාදෙයි. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසාය අංශය මඟින් ලංකාවේ සමස්ත ව්‍යවසායන්ගෙන් සියයට 75 ක් ද, සේවා නියුක්තියෙන් සියයට 45 ක් ද, දළ දේශීය නිෂ්පාදනයෙන් 52 ක ට ද දායකත්වය සපයන බැවින් එය මනාව ලාංකික ආර්ථිකය තුළ පිළිඹිබු වේ.

### 1.2.4. සංවර්ධන මූල්‍ය පිළිබඳ ක්‍රමෝපාය සැලසුම්

නිෂ්පාදකයින්ට තම වගාබිමේ දී ලබාදෙන මිල තහවුරු කරන අතරම ස්ථාවර වෙළඳ පොල මිලක් ලබා දීම සඳහා අතිරික්ත අස්වනු කළමනාකරණය කර කුඩා හා මධ්‍ය පරිමාණ ගොවීන් සහ අනෙකුත් වෙළඳපොල සාධකයන් කෙරෙහි අවධානය යොමු කරමින් සැපයුම් අංශය සහ ඉල්ලුම් පාර්ශවය තුලනය කිරීම.

ජාතික ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට වටිනා දායකත්වයක් ලබා දීමේ විභවයන් ඇති කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් දිරිමත් කිරීම හා නව ව්‍යවසායකයින් හඳුනා ගැනීම අරමුණු කරගෙන මෙම දෙපාර්තමේන්තුවේ මැදිහත් වීම යටතේ සහනදායී ණය, භාණ්ඩාගාර ඇපකර සහ තාක්ෂණික සහයන් සැපයීම ඇතුළු විවිධ රාජ්‍ය අනුග්‍රහයන් ලබා දීම සිදු කරනු ලබයි.

## 1.3 දෙපාර්තමේන්තුවේ කාර්යයන්

- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයන්හි සංවර්ධනය උදෙසා අවශ්‍ය ප්‍රතිපත්ති, ක්‍රමෝපායන් හා වැඩසටහන් සැකසීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

- වෙළඳපොල දත්ත විශ්ලේෂණය කොට ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයන්හි දියුණුවට බලපාන ප්‍රධාන ගැටලු හඳුනා ගැනීම සහ ඒ සඳහා අවශ්‍ය ඵලදායී විසඳුම් ලබාදීම.

- ආර්ථික සංවර්ධනය උදෙසා රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන සහනාධාර වැඩසටහන්වල ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ ඊට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

- වෙළඳපොල අවශ්‍යතාවයන් අනුව, බැංකු, රක්ෂණය, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සහ මූල්‍ය අංශයන්ට අදාළ නීති බලගැන්වීම සඳහා අවශ්‍ය සහසුකම් සැලසීම.

- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය, බැංකු, මූල්‍ය වෙළඳපොල සහ අනෙකුත් අංශයන්ට අදාළව රජයේ වාර්ෂික අයවැය සැකසීමේ ක්‍රියාවලියට අවශ්‍ය පහසුකම් සැපයීම.


- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය, ප්‍රාථමික ව්‍යවසාය අංශය සහ අනෙකුත් අංශයන්ට අදාළ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සහ විදේශ ණය ආධාර මත ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම.

- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය පිළිබඳව කෘෂිකාර්මික, කාර්මික, හා සේවා යන අංශ යටතේ දත්ත රැස් කිරීම හා ඒවා විශ්ලේෂණය කිරීම මඟින් පවතින දුෂ්කරතා හා ප්‍රතිපත්තිමය මැදිහත්වීම් හඳුනා ගැනීම.

- රජයේ අනුග්‍රහය මත ක්‍රියාත්මක කරනු ලබන මූල්‍ය සහන යෝජනා ක්‍රම පිළිබඳව සොයාබැලීම.

- රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයන් හි සංවර්ධන ව්‍යාපෘති සඳහා දේශීය බැංකු හා මූල්‍ය පහසුකම් ලබාදීම.

## 1.4 සංවිධාන සටහන




| | |
|---|---|
| නි. අ. | - නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| ස.අ. | - සහකාර අධ්‍යක්ෂ |
| සැ. ස. | - සැලසුම් සහකාර |
| ප. ස. | - පර්යේෂණ සහකාර |
| තො. ස. හා තා. ස. | - තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සහකාර |
| ක. ස. | - කළමනාකරණ සහකාර |
| රිය. | - රියදුරු |
| කා. කා. ස. | - කාර්යාල කාර්ය සහයක |

# 2. 2016 වර්ෂයේ කාර්යසාධනය

## 2.1 සමාලෝචනය

රටෙහි දිගුකාලීන වර්ධනය සහ තිරසාරභාවය සහතික කරන කාර්මික සහ සේවා අංශයන්ගේ ප්‍රධාන ක්ෂේත්‍ර සංවර්ධනය අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා රජය පුළුල් වැඩසටහන් සහ යෝජනා ක්‍රම රාශියක් 2016 වර්ෂයේ දී ආරම්භ කිරීමට මෙන්ම අඛණ්ඩව පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ මූල්‍ය අවශ්‍යතා සැපයීම මගින් රජය විසින් විශාල වශයෙන් ආයෝජනය කරන ලද ක්ෂේත්‍රයක් ලෙස සුළු හා මධ්‍ය පරිමාණ අංශය හඳුන්වා දිය හැකිය. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් තිරසාර වර්ධනයක් ලඟා කර ගැනීම සඳහා දායක වන එක් ප්‍රධාන හවුල්කරුවකු ලෙස හඳුනා ගන්නා රජය ඔවුන් තම මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමේ දී මුහුණ දෙන ගැටළුවලට විසඳුම් ලබා දීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා වූ ණය සුරැකුම් යෝජනා ක්‍රමය සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා වූ ව්‍යාපාර ප්‍රාග්ධන අරමුදල වැනි යෝජනා ක්‍රම ක්‍රියාවට නංවන ලදී. රටෙහි වර්ධනය වන ක්ෂුද්‍රමූල්‍ය අංශය නියාමනය සහ විධිමත් කිරීම සඳහා රජය විසින් ක්ෂුද්‍රමූල්‍ය පනත හඳුන්වා දුන් අතර විවිධ ක්ෂුද්‍රමූල්‍ය වැඩසටහන් ද ක්‍රියාත්මක කරනු ලැබීය.

රජය විසින් විශාල වශයෙන් ආයෝජනය කරන ලද තවත් ක්ෂේත්‍රයක් ලෙස කෘෂිකාර්මික අංශය හඳුන්වා දිය හැක. රසායනික පොහොර භාවිතය මගින් ඇති වන සෘණාත්මක ප්‍රතිඵල සීමා කිරීමේ අරමුණින් පොහොර සහනාධාරය, පොහොර සඳහා වූ මුදල් ප්‍රදානයක් ලෙස වෙනස් කරන ලදී. වී වලට අමතරව තවත් බෝග වගාවන් පහකට සහ කුඩා පරිමාණ වැවිලි කර්මාන්ත අංශයට ද ප්‍රතිලාභ සැලසීම සඳහා පොහොර සඳහා වූ මුදල් සහනාධාර වැඩසටහන පුළුල් කරන ලදී. එමෙන්ම, බෝග වර්ග 33 ක් සඳහා වන 'නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය', 'කෙතට අරුණ පොහොර දිරිය වගා රක්ෂණ යෝජනා ක්‍රමය' සහ 'ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය' යන යෝජනා ක්‍රම ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

කුඩා පරිමාණයේ වැවිලි කර්මාන්ත අංශය සඳහා වන නැවත වගා සහ නව වගා සහනාධාරය, ලියාපදිංචි තේ කර්මාන්ත ශාලා හිමියන් සඳහා වන කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය සහ දේශීය සීනි කර්මාන්ත අංශය සඳහා වන සංවර්ධන ප්‍රතිපත්ති සකස් කිරීම වැනි දිරිගැන්වීම් සහ සහනාධාර 2016 වර්ෂය ඇතුළත දී කුඩා පරිමාණ වැවිලි කර්මාන්ත අංශය වෙත ලබා දෙන ලදී. රජය ආහාර සුරක්ෂිතතා ගැටළුව පිළිබඳව අවධානය යොමු කරන අතර සහතික මිල සම්බන්ධයෙන් කරන ලද වෙනස්කම් ද සහිතව රජයේ වී මිල දී ගැනීමේ වැඩසටහන 2016 වර්ෂය තුළ දී ද ක්‍රියාවට නංවන ලදී. තවද, ජීවන වියදම කෙරෙහි බලපෑනු ලබන සහල් මිල ඉහළ යාම අවම කිරීමේ අදහසින් දේශීය පරිභෝජනය සඳහා රජය සහල් ආනයනය කරන ලදී.

රට තුළ පැවති අහිතකර කාලගුණික තත්ත්වය නිසා වී නිෂ්පාදනය පහළ මට්ටමක පැවතුන අතර ජීවන වියදම කළමනාකරණය කිරීම සඳහා සහල් ඇතුළු අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය 16 ක් සඳහා උපරිම සිල්ලර මිලක් ද පනවන ලදී. වී, බඩඉරිඟු, මුං ඇට සහ අනෙකුත් ධාන්‍ය වැනි කෘෂි නිෂ්පාදන සඳහා උසස් තත්ත්වයෙන් යුතු ගබඩා පහසුකම් සැපයීම වෙනුවෙන් ලෝක බැංකුව හා ඒකාබද්ධව බුත්තල සහ මන්නාරම යන ප්‍රදේශවල නවීන පන්නයේ ගබඩා අළුතින් ඉදි කරන ලද අතර, එය ද කෘෂි නිෂ්පාදන සඳහා හොඳ මිලක් ලබා ගැනීමට දායක විය.

පශු සම්පත් අංශයේ සංවර්ධනය සඳහා විශේෂ ණය යෝජනා ක්‍රම හඳුන්වා දුන් අතරම බඩඉරිඟු, සෝයා බෝංචි, අර්තාපල්, ලොකු ලූනු සහ මිරිස් සඳහා 'පංච බෝග උපක්‍රමය' හඳුන්වා දෙන ලදී. එමෙන්ම, මල් වගා සහ ගෙවතු වගා අංශයන්ගේ සංවර්ධනය කෙරෙහි ද අවධානය යොමු කරන ලදී.

තවද, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වන විශේෂ පොළී අනුපාතය ලබා දීම, පුනරුත්ථාපන අභ්‍යාසලාභීන් සඳහා වන ස්වයංරැකියා ණය යෝජනා ක්‍රමය සහ කලාකරුවන් හා මාධ්‍යවේදීන් සඳහා වන විශේෂ වාහන ණය යෝජනා ක්‍රමය වැනි යෝජනා ක්‍රම හරහා විශේෂ දිරි දීමනාවන් ඉලක්කගත කණ්ඩායම් වෙත ලබා දෙන ලදී.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, රටේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කර ගන්නා අතරම ජීවන වියදම පහළ මට්ටමක පවත්වා ගනිමින් සුළු හා මධ්‍ය පරිමාණ අංශයෙන් දළ දේශීය

නිෂ්පාදිතයට කැපී පෙනෙන දායකත්වයක් ද සහිතව එම අංශයේ සැලකිය යුතු වර්ධනයක් ද අත්පත් කර ගන්නා ලදී.

## 2.2 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය

### 2.2.1 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා මූල්‍ය පහසුකම් සැපයීම.


රැකියා උත්පාදනය, දළ දේශීය නිෂ්පාදනයට දක්වනු ලබන දායකත්වය සහ සැමට සාධාරණ සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා දක්වන දායකත්වය සැලකිල්ලට ගනිමින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රය රටෙහි සමස්ත ආර්ථිකයේ කොඳු නාරටිය ලෙස රජය පිළිගෙන ඇත. සාම්ප්‍රදායික බැංකුකරණ රාමුවෙන් මිදී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ඔවුන් යෙදී සිටින ව්‍යාපාර ක්ෂේත්‍රය තුළ මීළඟ ඉහළ තලයට ඔසවා තැබීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම වෙනුවෙන් ඔවුන් සඳහා පවත්නා මූල්‍ය පහසුකම් වැඩි දියුණු කිරීමට රජය විසින් මූල්‍ය ආයතන නිරතුරුවම දිරි ගන්වනු ලැබේ. 2016 වර්ෂය තුළ දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ මූල්‍යමය අවශ්‍යතාවන් සපුරාලීම සඳහා රු. බිලියන 719 ක මුදලක් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වාණිජ හා සංවර්ධන බැංකු විසින් ණය වශයෙන් ලබා දී ඇත. අදාළ තොරතුරු වගු අංක 2.1 හි දැක්වේ.

**වගුව 2.1 : වාණිජ හා සංවර්ධන බැංකු විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වෙත ලබා දුන් ණය - 2016**

| බැංකුව | කෘෂිකාර්මික | | සේවා | | කර්මාන්ත | | වෙනත් | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ණය සංඛ්‍යාව | මුළු ණය වටිනාකම (රු. මිලියන) | ණය සංඛ්‍යාව | මුළු ණය වටිනාකම (රු. මිලියන) | ණය සංඛ්‍යාව | මුළු ණය වටිනාකම (රු. මිලියන) | ණය සංඛ්‍යාව | මුළු ණය වටිනාකම (රු. මිලියන) | ණය සංඛ්‍යාව | මුළු ණය වටිනාකම (රු. මිලියන) |
| ලංකා බැංකුව | 1,294 | 6,072 | 630 | 1,678 | 815 | 3,481 | 61,182 | 112,708 | 63,921 | 123,939 |
| මහජන බැංකුව | 742 | 866 | 226 | 1,017 | 369 | 1,107 | 1,194 | 2,551 | 2,531 | 5,541 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 0 | 0 | 0 | 0 | 23 | 781 | 8 | 185 | 31 | 966 |
| ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව | 643 | 190 | 46 | 163 | 103 | 381 | 172 | 113 | 964 | 847 |
| සණස සංවර්ධන බැංකුව | 5,022 | 4,158 | 2,481 | 4,245 | 14,210 | 11,176 | 5,790 | 4,347 | 27,503 | 23,926 |
| ජාතික සංවර්ධන බැංකුව | 2,328 | 5,717 | 513 | 2,362 | 24,941 | 28,551 | 1,902 | 3,017 | 29,684 | 39,647 |
| ඩී.එෆ්.සී.සී. බැංකුව | 530 | 5,062 | 3,029 | 17,241 | 1,622 | 11,954 | 2,272 | 3,829 | 7,453 | 38,086 |
| කොමර්ෂල් බැංකුව | 3,724 | 11,763 | 25,814 | 169,896 | 14,284 | 35,806 | 14,941 | 55,449 | 58,763 | 272,914 |
| සම්පත් බැංකුව | 371 | 4,279 | 218 | 3,527 | 1,707 | 12,064 | 2,727 | 18,233 | 5,023 | 38,103 |
| සෙලාන් බැංකුව | 525 | 2,516 | 1,739 | 16,254 | 1,532 | 9,405 | 856 | 4,307 | 4,652 | 32,482 |
| හැටන් නැෂනල් බැංකුව | 6,016 | 11,198 | 16,715 | 75,271 | 4,200 | 19,694 | 2,147 | 6,782 | 29,078 | 112,945 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | 155 | 2,264 | 19 | 78 | 197 | 1,090 | 1,121 | 5,458 | 1,492 | 8,890 |
| ස්ටැන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැංකුව | 1 | 46 | 46 | 507 | 52 | 500 | 1 | 1 | 100 | 1,054 |
| යුනියන් බැංකුව | 154 | 1,157 | 712 | 1,331 | 4,274 | 17,093 | 285 | 491 | 5,425 | 20,072 |
| **එකතුව** | **21,505** | **55,288** | **52,188** | **293,570** | **68,329** | **153,083** | **94,598** | **217,471** | **236,620** | **719,412** |

මූලාශ්‍රය : අදාළ බැංකු

2016 වර්ෂය තුළ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වාණිජ හා සංවර්ධන බැංකු විසින් ප්‍රදානය කරන ලද සමස්ත ණය සංඛ්‍යාවෙන් සියයට 9 ක් කෘෂිකාර්මික අංශයටත්, සියයට 22 ක් සේවා අංශයටත්, සියයට 29 ක් කර්මාන්ත අංශයටත් ලබා දී ඇති අතර සියයට 40 ක් පොදුවේ අනෙකුත් ක්ෂේත්‍රයන් සඳහා ලබා දී ඇත.




### 2.2.2 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසාය ණය යෝජනා ක්‍රමය (SMELoC)

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ වැදගත්කම සහ එම අංශයේ ගැටළු හඳුනාගනිමින්, එම අංශයේ වර්ධනයට පවතින ප්‍රධානතම බාධකය මූල්‍ය සඳහා ප්‍රවේශය වන බැවින් එම අවස්ථා ඉහළ නැංවීමේ වැදගත්කම රජය විසින් හඳුනාගෙන ඇත. ඒ අනුව, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ ප්‍රාග්ධන අවශ්‍යතා ඔවුනට දැරිය හැකි පොළී අනුපාතයක් යටතේ සපුරාලීමට අවස්ථාව ලබා දීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ පොදු ප්‍රාග්ධන සම්පත් අරමුදලෙන් ඇමරිකානු ඩොලර් මිලියන 100 ක ණය මුදලක් ලබා ගැනීම සඳහා 2016 වර්ෂයේ පෙබරවාරි මස 23 වන දින මුදල් අමාත්‍යාංශය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර ණය ගිවිසුමක් අත්සන් කරන ලදී.

තවද, පුළුල් තෝරා ගැනීමේ නිර්ණායකයන් මත පදනම්ව මහජන බැංකුව, ලංකා බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, කොමර්ෂල් බැංකුව, සම්පත් බැංකුව, හැටන් නැෂනල් බැංකුව, ඩී.එෆ්.සී.සී. බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සහ සෙලාන් බැංකුව යන බැංකු 10 මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසුකම් ලැබූ සහභාගීත්ව මූල්‍ය ආයතන ලෙස ආසියානු සංවර්ධන බැංකුව විසින් තෝරා ගන්නා ලදී.

මෙම ණය යෝජනා ක්‍රමය ආරම්භයේ දී වෙන්දේසි ක්‍රමය යොදා ගනිමින් ක්‍රියාවට නංවනු ලැබූ අතර 2016 අප්‍රේල් 27 වන දින පවත්වනු ලැබූ පළමු වෙන්දේසිය සඳහා සහභාගී වූ සහභාගීත්ව මූල්‍ය ආයතන 09 අතරින් ජාතික සංවර්ධන බැංකුව විසින් වෙන්දේසියට ඉදිරිපත් කරනු ලැබූ මුළු මුදල වන ඇමරිකානු ඩොලර් මිලියන 12.5 ක මුදල සියයට 6.01 ක වාර්ෂික පොළී අනුපාතයක් යටතේ ලබා ගන්නා ලදී.

දෙවැනි වෙන්දේසිය 2016 සැප්තැම්බර් 28 වන දින පවත්වන ලද අතර මෙමගින් සහභාගීත්ව මූල්‍ය ආයතන 03 කට අරමුදල් ලබා ගැනීමේ අවස්ථාව උදා විය. පළමු හා දෙවැනි වෙන්දේසිවලට අදාළ තොරතුරු වගු අංක 2.2 හි දැක්වේ.

වගුව 2.2 : සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමයේ වෙන්දේසිවල ප්‍රගතිය

| වෙන්දේසිය | සහභාගීත්ව මූල්‍ය ආයතන | ලංසු අනුපාතය (%) | වෙන් කරන ලද මුදල (ඇ. ඩොලර්) |
|---|---|---|---|
| 1 | ජාතික සංවර්ධන බැංකුව | 6.01 | 12.500 |
| 2 | ඩී.එෆ්.සී.සී. බැංකුව | 11.01 | 4.166 |
| | හැටන් නැෂනල් බැංකුව | 8.60 | 4.166 |
| | සම්පත් බැංකුව | 8.25 | 4.166 |
| **එකතුව** | | | **24.998** |

මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

2017 අප්‍රේල් 30 වන දිනට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමයේ ප්‍රගතිය පහත වගුවේ දැක්වේ.

**වගුව 2.3 : 2017 අප්‍රේල් 30 වන දිනට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමයේ ප්‍රගතිය**

| වෙන්දේසිය | සහභාගීත්ව මූල්‍ය ආයතනය | වෙන් කළ මුදල | | ප්‍රතිමූල්‍ය කරන ලද මුදල | | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|
| | | ඇ.ඩො. මිලියන | රු. මිලියන | ණය සංඛ්‍යාව | මුදල (රු. මිලියන) | |
| පළමු වෙන්දේසිය | ජාතික සංවර්ධන බැංකුව | 12.500 | 1,821.83 | 160 | 1,821.83 | 100 |
| **උප එකතුව** | | **12.500** | **1,821.83** | **160** | **1,821.83** | **100** |
| දෙවන වෙන්දේසිය | හැටන් නැෂනල් බැංකුව | 4.166 | 624.99 | 47 | 624.99 | 100 |
| | ඩී.එෆ්.සී.සී. බැංකුව | 4.166 | 624.99 | 48 | 624.29 | 99 |
| | සම්පත් බැංකුව | 4.166 | 624.99 | 34 | 540.91 | 86 |
| **උප එකතුව** | | **12.498** | **1,874.98** | **129** | **1,790.19** | **95** |
| **මුළු එකතුව** | | **24.998** | **3,696.81** | **289** | **3,612.02** | **97** |

මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

### 2.2.3 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන වැඩසටහන - ජර්මානු ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන වැඩසටහන ජර්මානු ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය (GIZ) හරහා ක්‍රියාත්මක කිරීම සඳහා යූරෝ මිලියන 2.785 ක මුදල් ප්‍රදානයක් ලබා දෙමින් ජර්මානු ෆෙඩරල් ජනරජය සහ ශ්‍රී ලංකා රජය අතර තාක්ෂණික සහයෝගීතා ගිවිසුමක් 2012 වර්ෂයේ දී අත්සන් කරන ලදී. ව්‍යාපෘති කාල සීමාව 2016 දෙසැම්බර් මාසය දක්වා දීර්ඝ කරන ලද අතර, යූරෝ මිලියන 3 ක අමතර ප්‍රතිපාදන ද ලබා දෙන ලදී. මෙම වැඩසටහනට පහත සඳහන් අංශ ඇතුළත් වේ.

1. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය පිළිබඳ ප්‍රතිපත්තිය
2. තාක්ෂණය සඳහා වූ ප්‍රවේශය
3. මූල්‍ය ප්‍රවේශය

ප්‍රගති වාර්තාවට අනුව, 2016 වර්ෂය තුළ දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ සංවර්ධන කටයුතු සඳහා රු. මිලියන 217 ක පමණ මුදලක් ජර්මානු ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය විසින් වැය කර ඇත.

තවද, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන වැඩසටහනේ දෙවන අදියර 2017 ජනවාරි මාසයේ ආරම්භ කළ අතර 2019 මාර්තු මාසය දක්වා ක්‍රියාත්මක වේ. මෙම වැඩසටහනට යූරෝ මිලියන 03 ක් වැය කරනු ලබන අතර ''ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ සංවර්ධනය II'' නමින් මෙම වැඩසටහන හඳුන්වනු ලැබේ.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන වැඩසටහනේ දෙවන අදියරේ අරමුණ වනුයේ පසුගාමී සංවර්ධනයක් පවතින ප්‍රදේශවල සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල තරඟකාරීත්වය, සියළු පාර්ශවයන්ගේ අන්තර්ගතභාවය සහ පාරිසරික තිරසාරභාවය ඉහළ නැංවීමයි. මෙම වැඩසටහන ක්ෂේත්‍ර 4 කින් සමන්විත වේ.

1. ප්‍රතිපත්ති සහ ආයතනික කොන්දේසි රාමුව
2. මූල්‍ය ප්‍රවේශය
3. තාක්ෂණික හා වෙළඳපොල සඳහා වූ ප්‍රවේශය
4. නව සොයා ගැනීම් සහ ව්‍යවසායකත්වය

### 2.2.4 ජාතික ණය සුරැකුම් ආයතනය

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය රටේ ආර්ථිකයේ කොඳු නාරටිය ලෙස සැලකුවත්, දුර්වල කාර්ය සාධනය හේතුවෙන් ආර්ථිකයට එම අංශයේ උපරිම දායකත්වය ලබා ගැනීමට අපොහොසත් වී ඇත. මෙයට බලපෑ එක් ප්‍රධාන හේතුවක් වනුයේ විධිමත් ආයතනික මූල්‍ය අංශයෙන් දැරිය හැකි මිලකට තම මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමට නොහැකි වීමය.

සාමාන්‍යයෙන්, මුදල් ප්‍රවාහය මත පදනම්ව ණය ලබා ගැනීමට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට වඩාත් කැමති වුවද, සාම්ප්‍රදායික බැංකු ඇප මත පදනම්ව ණය ලබා දීමට වැඩි කැමැත්තක් දක්වයි. එම නිසා, බැංකු විසින් ඉල්ලා සිටින සුදුසු ඇප/තෙවන පාර්ශවයක් මඟින් ලබා දෙනු ලබන සුරැකුම් ඉදිරිපත් කිරීමට නොහැකි වීම නිසා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් බහුතරයකට ණය පහසුකම් ලබා ගැනීමට නොහැකි වී ඇත. තවද, තම ඉඩම්වල ඔප්පු තවමත් නිසි පරිදි නිදහස් කර නොමැති බැවින් එම ඉඩම්, ණය ලබා ගැනීමේ දී ඇප ලෙස ඉදිරිපත් කිරීමට නොහැකි වීමෙන් උතුරු හා නැගෙනහිර පළාත්වල ජනතාවට මෙම ගැටළුවට නිරන්තරයෙන් මුහුණ දීමට සිදු වී ඇත.

මෙම ගැටළු සැලකිල්ලට ගනිමින්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් විධිමත් බැංකු අංශයෙන් ලබා ගන්නා ණය පහසුකම් සඳහා සුරැකුම් ලබා දීමට ජාතික ණය සුරැකුම් යෝජනා ක්‍රමයක් හඳුන්වා දීමට රජය යෝජනා කරන ලදී. ඒ අනුව, ආසියානු සංවර්ධන බැංකුව සමඟ මේ පිළිබඳව සාකච්ඡා කරනු ලැබූ අතර, ජාතික ණය සුරැකුම් ආයතනය පිහිටුවීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 100 ක ණය මුදලක් ලබා දීමට ඔවුන් එකඟ වී ඇත. ආසියානු සංවර්ධන බැංකුවේ සහාය ඇතිව මේ සඳහා වූ වෙළඳපොල ඉල්ලුම් විශ්ලේෂණයක් කරනු ලැබූ අතර, එමඟින් ශ්‍රී ලංකා සමාගම් පනත යටතේ පොදු සීමිත සමාගමක් ලෙස මෙම ජාතික ණය සුරැකුම් ආයතනය ස්ථාපිත කිරීමට යෝජනා කර ඇත. මෙයට සමගාමීව, මෙම ජාතික ණය සුරැකුම් ආයතනය ස්ථාපිත කිරීමට අවශ්‍ය මූලික ප්‍රාග්ධනය වශයෙන් රු. මිලියන 500 ක මුදලක් 2017 අයවැය මඟින් වෙන් කර ඇත.

### 2.2.5 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ව්‍යාපාර ප්‍රාග්ධන අරමුදල

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අරමුණු කරගත් ව්‍යාපාර ප්‍රාග්ධන අරමුදලක් පිහිටුවීමේ සංකල්පය 2016 අයවැය යෝජනා මඟින් හඳුන්වා දෙන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා අවශ්‍ය කොටස් ප්‍රාග්ධනය සපයා ගැනීමේ විකල්පයක් වශයෙන් ව්‍යාපාර ප්‍රාග්ධන අරමුදලක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය වෙළඳපොල විශ්ලේෂණයක් සිදු කිරීමට අවශ්‍ය සහාය, රජය ආසියානු සංවර්ධන බැංකුවෙන් ඉල්ලා සිටින ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ආසියානු සංවර්ධන බැංකුව විසින් පුළුල් වෙළඳපොල විශ්ලේෂණයක් සිදු කරනු ලැබූ අතර යෝජිත ව්‍යාපාර ප්‍රාග්ධන අරමුදල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වූ නිර්දේශ සහිත කෙටුම්පත් වාර්තාවක් ද සම්පාදනය කරන ලදී.

ඒ අනුව, වෙළඳපොල සමීක්ෂණයේ සොයා ගැනීම් මත පදනම්ව සකස් කරන ලද ව්‍යාපාර ප්‍රාග්ධන අරමුදල ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් වූ කෙටුම්පත් වාර්තාව පිළිබඳ එහි පාර්ශවකරුවන්ගේ අදහස් ලබා ගැනීම සඳහා සම්මන්ත්‍රණයක් ද පවත්වන ලදී.

සංවර්ධනයට ඇති බලපෑම සලකා බලන විට පහත සඳහන් අරමුණු ඇතුළුව රජයේ ප්‍රතිපත්තිමය අරමුණු රැසක් මෙම ව්‍යාපාර ප්‍රාග්ධන අරමුදල මඟින් ප්‍රවර්ධනය කරනු ඇත.

- සේවා අංශය පදනම් කර ගනිමින් වර්ධනය වන ශ්‍රී ලාංකීය ආර්ථික ප්‍රවණතාවය තුළ ඉහළ මට්ටමේ කුසලතා මත පදනම් වූ රැකියා අවස්ථා විශාල සංඛ්‍යාවක් ඇති කිරීම.
- තරුණ පරපුර සඳහා රැකියා අවස්ථා පුළුල් කිරීම.
- නව නිපැයුම් අවස්ථාව ලබා දීම සහ දිරිමත් කිරීම.
- ශ්‍රී ලංකාවේ අපනයන ධාරිතාවය ඉහළ නැංවීම.
- කොටස් ආයෝජන සහ විදේශ ආයෝජන මෙරටට ගලා ඒමට සැලස්වීමෙන් දේශීය ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධනය සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්ගේ ණය ධාරිතාවය පුළුල් කිරීම.

ඒ අනුව, මෙම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අරමුණු කරගත් ව්‍යාපාර ප්‍රාග්ධන අරමුදල නොපමාව පිහිටු වීම සඳහා රජය ආසියානු සංවර්ධන බැංකුව සමඟින් වැඩි දුරටත් කටයුතු කරමින් සිටී.

## 2.3 ක්ෂුද්‍රමූල්‍යායනය

පසුගිය වසර කිහිපය පුරා ක්ෂුද්‍රමූල්‍යායනය ආර්ථිකයේ සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරන ලදී. මෙය දිළිඳුකම පිටුදැකීම, ආර්ථික හා සමාජීය වශයෙන් දුගී ජන කොටස් බලගැන්වීම සඳහා ඵලදායී මෙවලමක් ලෙස ප්‍රමුඛ  කාර්යයක් සිදු කරනු ලබයි. ක්ෂුද්‍ර හා කුඩා ව්‍යවසායන්ට ක්ෂුද්‍ර

ණය පහසුකම් සැපයීම, ගෙවීම් පද්ධතීන් ඇති කිරීම හා කුටුම්භයන්හි නව ඉතිරි කිරීම් අවස්ථා ඇති කිරීම තුළින් දේශීය ආර්ථිකය හා අන්තර් සම්බන්ධිත මූල්‍ය ක්ෂේත්‍රයක් ගොඩ නැගීමට මහඟු දායකත්වයක් ක්ෂුද්‍රමූල්‍යනය තුළින් ලබා දෙයි. තවද, කුඩා පරිමාණ කර්මාන්ත, ඉදි කිරීම් හා වෙළඳ යන අනෙකුත් ක්ෂේත්‍රයන්හි ප්‍රමාණාත්මක වර්ධනයක් සඳහා ද මෙය දායක වී ඇත.

පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍රමූල්‍ය ක්ෂේත්‍රය සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර ඇති හෙයින් ක්ෂුද්‍රමූල්‍ය ආයතන නියාමනය ප්‍රතිපත්තිමය වශයෙන් අත්‍යවශ්‍ය සාධකයක් විය. ඒ අනුව, 2016 අංක 6 දරණ ක්ෂුද්‍රමූල්‍ය පනත මගින් මෙතෙක් කිසියම් හෝ නියාමනයකට භාජනය නොවූ ක්ෂුද්‍රමූල්‍ය ආයතන නියාමනය කිරීමේ ක්‍රමවේදයකට යටත් කර ඇත. අඩු ආදායම්ලාභීන්ට හා ක්ෂුද්‍ර ව්‍යාපාර කටයුතුවලට පහසුකම් සැලසීම, වැඩි දියුණු කිරීම, මූල්‍යමය අන්තර්ගතභාවය ඉහළ නැංවීම, මූල්‍ය ආයතනවල ස්ථායිතාවය හා පද්ධතීන් ශක්තිමත් කිරීම, ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල අරමුදල් මූලාශ්‍ර පිළිබඳ පුළුල් ප්‍රවේශයක් ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීම, පාරිභෝගික රැකවරණය ප්‍රවර්ධනය කිරීම හා සුරක්ෂිත සහ ස්ථාවර මූල්‍ය පද්ධතියක් ප්‍රවර්ධනය කිරීම මෙම පනතෙහි ප්‍රධාන අරමුණු වේ.

ක්ෂුද්‍රමූල්‍ය පනත 2016 ජූලි මස 15 වන දින සිට බලාත්මක වේ. මෙම පනත මගින් ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරවල නිරතවන සමාගම් සඳහා බලපත්‍ර නිකුත් කිරීමට, එම සමාගම් වෙත නීති හා විධාන නිකුත් කිරීම සහ ක්ෂුද්‍රමූල්‍ය/ක්ෂුද්‍ර ණය රාජ්‍ය නොවන සංවිධාන අධීක්ෂණය කිරීම සඳහා ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත මාර්ගෝපදේශ නිකුත් කිරීමට ද මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත බලය පැවරී ඇත. මෙම අරමුණු ඉටු කර ගැනීම, සහතික කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී.

ක්ෂුද්‍රමූල්‍ය පනතෙහි විධිවිධානයන්ට අනුව එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මුදල් මණ්ඩලය විසින් පියවර ගෙන ඇත. පනතෙහි 13 වන වගන්තියට අනුව බලපත්‍රය ලබා ගැනීම සඳහා වන නිර්ණායක හා බලපත්‍ර ගාස්තුව වශයෙන් නීති දෙකක්ද, 11 වන වගන්තිය අනුව ප්‍රාග්ධනය, ද්‍රවශීල වත්කම්, ව්‍යවස්ථාපිත සංචිත, තැන්පතු, ණය පහසුකම්, කොටස් හිමියන් පිළිබඳ තක්සේරුව, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල පාලන කටයුතු සිදු කරන පුද්ගලයන්ගේ සුදුසුකම් සහ යෝග්‍යතාවය තහවුරු කිරීම සහ වාර්තා කිරීමේ අවශ්‍යතා වැනි ප්‍රධාන විචක්ෂණශීලී අවශ්‍යතා ආවරණය වන පරිදි විධානයන් අටක් ද 2016 ඔක්තෝම්බර් 27 දින සිට බලපැවැත්වෙන පරිදි නිකුත් කර ඇත.

ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා යටතේ ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන අධීක්ෂණය කිරීමට අවශ්‍ය මූලධර්ම, විධාන, හා මාර්ගෝපදේශ ක්ෂුද්‍රමූල්‍ය පනතේ වගන්ති අංක 28(1) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් අනුමත කර ඇත. ඒ අනුව, ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන පාලනය කිරීම සඳහා මෙම මූලධර්ම, විධාන, හා මාර්ගෝපදේශ සඳහා අවශ්‍ය නීතිරීති සකස් කර ඒවා බලාත්මක කළ යුතුය.

විවිධ ආයතන හරහා රට තුළ ග්‍රාමීය හා දුරස්ථ ප්‍රදේශවල වෙසෙන අඩු ආදායම්ලාභී පුද්ගලයින් හා මූල්‍යමය පහසුකම් නොමැති ජනකොටස් වෙත අවශ්‍ය සහනදායී ණය පහසුකම් සැපයීමේ ප්‍රධාන භූමිකාවක් රජය විසින් සිදු කරනු ලබයි. ඒ අනුව, රජයේ ප්‍රමුඛ ක්ෂුද්‍රමූල්‍ය ආයතන විසින් සැලකිය යුතු මට්ටමේ ක්ෂුද්‍ර ණය ප්‍රමාණයක් රට තුළ මූල්‍යමය අවශ්‍යතාවයක් ඇති පුද්ගලයින් සඳහා 2016 වසර තුළ ප්‍රදානය කර ඇත. රාජ්‍ය ආයතන මගින් 2016 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ක්ෂුද්‍රමූල්‍ය වැඩසටහන්වල ප්‍රගතිය පහත වගුවේ දැක්වේ.

**වගුව 2.4 : ප්‍රධාන ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල ප්‍රගතිය - 2016**


| ක්ෂුද්‍රමූල්‍ය ආයතනය | ශාඛා සංඛ්‍යාව | තැන්පත්කරුවන් සංඛ්‍යාව | ණය ලාභීන්ගේ සංඛ්‍යාව | මුළු තැන්පතු ප්‍රමාණය (රු. මිලියන) | මුළු ආයෝජන (රු. මිලියන) | මුළු ණය ප්‍රමාණය (රු. මිලියන) |
|---|---|---|---|---|---|---|
| දිවිනැගුම ප්‍රජා මූල බැංකු | 1,074 | 7,417,540 | 1,272,504 | 76,961 | 68,782 | 42,982 |
| සමූපකාර ග්‍රාමීය බැංකු | 2,227 | 9,394,710 | 548,910 | 101,225 | 102,567 | 49,722 |
| ගොවිජන බැංකු | 551 | 521,101 | 571,384 | 323 | 8,302 | 1,207 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 268 | 5,730,651 | 564,080 | 43,792 | 20,926 | 106,802 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව | 8 | 63,987 | 8,848 | 396 | 5,361 | 3,740 |
| **එකතුව** | **4,128** | **23,127,989** | **2,965,726** | **222,697** | **205,938** | **204,453** |

මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

ක්ෂුද්‍රමූල්‍ය ආයතන විසින් ණය හෝ තැන්පතු වශයෙන් මූල්‍ය පහසුකම් සපයනු ලබයි. ඒ අනුව, 2016 වර්ෂය අවසන් වන විට ප්‍රධාන ක්ෂුද්‍රමූල්‍ය ආයතන විසින් ක්ෂුද්‍රමූල්‍ය ක්ෂේත්‍රයට ලබා දී ඇති මුළු ණය ප්‍රමාණය රු. බිලියන 204 ඉක්මවයි. එය ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, සියයට 52 ක් ද (රු. බිලියන 106), සමුපකාර ග්‍රාමීය බැංකු සියයට 24 ක් ද (රු. බිලියන 49), සහ දිවිනැගුම ප්‍රජා මූල බැංකු සියයට 20 ක් ද (රු. බිලියන 42) ලෙස ද වේ. 2016 වර්ෂය අවසන් වන විට දිළිඳු ජනතාවගේ අනිවාර්ය ඉතුරුම් රු. බිලියන 222 ක දක්වා ඉහළ ගොස් ඇති අතර එයින් රු. බිලියන 205 ක් දිගු කාලීන හා කෙටි කාලීන ආයෝජනයන්හි යොදවා ඇත.

රූප සටහන 2.2 : ප්‍රධාන බැංකු විසින් ක්ෂුද්‍රමූල්‍ය අංශයට ලබා දී ඇති ණය ප්‍රමාණය - 2016




2016 වර්ෂයේ දී වාණිජ බැංකු විසින් ක්ෂුද්‍රමූල්‍ය අංශයට ලබා දී ඇති මුළු ණය මුදල රු. බිලියන 130 ක් වන අතර එයින් රු. බිලියන 75 ක් ලංකා බැංකුව විසින් නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (සරුසාර), දිළිඳුබව තුරන් කිරීමේ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපෘතිය හා "සෞභාග්‍ය" යන ණය යෝජනා ක්‍රම හරහා සුළු පරිමාණ ණය ලෙස ලබා දී ඇත. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා මහජන බැංකුව 2016 වර්ෂය තුළ පිළිවෙලින් රු. බිලියන 29 ක් හා රු. බිලියන 10 ක් ක්ෂුද්‍රමූල්‍ය අංශයට ණය ලෙස ප්‍රදානය කර ඇත. රජයේ බැංකුවලට සාපේක්ෂව පෞද්ගලික බැංකු විසින් ද විවිධ ක්ෂුද්‍රමූල්‍ය ණය යෝජනා ක්‍රම හරහා ණය ලබා දී ඇති අතර එයින් සම්පත් බැංකුව හා හැටන් නැෂනල් බැංකුව ඉදිරියෙන් සිටී.

## 2.4 කෘෂිකාර්මික ක්ෂේත්‍රය නගා සිටුවීම.

### 2.4.1 ගොවීන්ගේ නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා පොහොර සහනාධාරය

වී ගොවිතැන සඳහා ශ්‍රී ලාංකේය කෘෂි ආර්ථිකයේ ප්‍රමුඛස්ථානයක් හිමි වී ඇත. එම නිසා රජය විසින් පොහොර සහනාධාරය, වී සඳහා සහතික මිල, වගා ණය සඳහා පොළී සහනාධාරය, වගා රක්ෂණය යනාදී විවිධ වූ දිරි දීමනා ලබා දීම මඟින් වී ගොවියාගේ සුරක්ෂිතභාවය නිරතුරුවම තහවුරු කර තිබේ. මෙකී දිරි දීමනා අතරින්, පොහොර සහනාධාරය ඉතා සුවිශේෂී ලෙස සලකනු ලබනුයේ එමඟින් දිවයින පුරා මිලියනයකට අධික වී ගොවීන් සංඛ්‍යාවක් ප්‍රතිලාභ අත්විඳිනු ලබන බැවිනි.

පොහොර සහනාධාරය සඳහා වාර්ෂික අයවැයෙන් රු. බිලියන 35 ක් පමණ වෙන් කෙරෙන අතර, එම වැඩසටහන සඳහා දරනු ලබන වියදම කෘෂිකාර්මික ක්ෂේත්‍රය සඳහා වෙන් කරනු ලබන මුළු ප්‍රතිපාදන ප්‍රමාණයෙන් සියයට 60 ක් පමණ වේ. 2015/16 මහ කන්නයේ දී, වී ගොවීන් 910,320 ක් සඳහා පොහොර මෙ.ටො. 185,615 ක් කිලෝ 50 ක පොහොර මිටියක් රු. 350/- ක සහනාධාර මුදලකට රාජ්‍ය පොහොර සමාගම් දෙක මඟින් ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන ජාලය හරහා බෙදා දී තිබේ.


වගුව 2.5 : පොහොර සහනාධාර වැඩසටහනේ ප්‍රගතිය - 2015/16 මහ කන්නය

| # | දිස්ත්‍රික්කය | පොහොර ලබා ගත් ගොවීන් සංඛ්‍යාව | වගා කරනු ලැබූ බිම් ප්‍රමාණය (හෙක්.) | බෙදා දෙනු ලැබූ පොහොර ප්‍රමාණය (මෙ.ටො.) | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | යූරියා | ටී.එස්.පී. | එම්.ඕ.පී. | එකතුව |
| 1 | කොළඹ | 7,682 | 2,790 | 262 | 138 | 289 | 689 |
| 2 | ගම්පහ | 25,978 | 8,416 | 911 | 357 | 787 | 2,054 |
| 3 | කළුතර | 27,187 | 4,314 | 985 | 524 | 1,093 | 2,602 |
| 4 | මහනුවර | 29,522 | 5,035 | 2,113 | 2,976 | 779 | 5,869 |
| 5 | මාතලේ | 34,322 | 20,154 | 3,592 | 877 | 1,036 | 5,504 |
| 6 | නුවර එළිය | 13,035 | 4,671 | 871 | 229 | 262 | 1,362 |
| 7 | ගාල්ල | 23,456 | 9,529 | 827 | 503 | 876 | 2,206 |
| 8 | මාතර | 23,633 | 9,811 | 1,320 | 422 | 773 | 2,515 |
| 9 | හම්බන්තොට | 50,463 | 37,600 | 7,737 | 1,827 | 2,020 | 11,584 |
| 10 | කුරුණෑගල | 156,585 | 30,695 | 13,726 | 3,293 | 3,598 | 20,616 |
| 11 | පුත්තලම | 24,260 | 22,502 | 3,590 | 869 | 944 | 5,403 |
| 12 | අනුරාධපුරය | 56,265 | 50,755 | 11,632 | 1,795 | 1,745 | 15,172 |
| 13 | පොළොන්නරුව | 70,598 | 26,730 | 13,639 | 3,194 | 3,424 | 20,257 |
| 14 | බදුල්ල | 47,928 | 25,111 | 4,929 | 1,181 | 1,330 | 7,440 |
| 15 | මොණරාගල | 56,974 | 36,932 | 6,674 | 1,550 | 1,813 | 10,038 |
| 16 | රත්නපුර | 30,418 | 5,086 | 2,075 | 578 | 908 | 3,562 |
| 17 | කෑගල්ල | 19,562 | 5,395 | 511 | 270 | 551 | 1,332 |
| 18 | අම්පාර | 76,044 | 39,145 | 15,498 | 3,542 | 3,823 | 22,863 |
| 19 | ත්‍රිකුණාමලය | 37,417 | 15,891 | 6,732 | 1,544 | 1,740 | 10,016 |
| 20 | මඩකලපුව | 32,730 | 42,193 | 7,459 | 1,661 | 1,960 | 11,080 |
| 21 | වව්නියාව | 14,300 | 17,277 | 3,073 | 830 | 938 | 4,842 |
| 22 | යාපනය | 15,127 | 9,479 | 1,525 | 331 | 414 | 2,270 |
| 23 | මන්නාරම | 15,998 | 19,519 | 4,084 | 968 | 1,056 | 6,108 |
| 24 | මුලතිව් | 11,351 | 14,213 | 2,743 | 637 | 720 | 4,099 |
| 25 | කිලිනොච්චිය | 9,485 | 10,257 | 2,581 | 2,311 | 1,241 | 6,134 |
| | **එකතුව** | **910,320** | **473,501** | **119,090** | **32,408** | **34,117** | **185,615** |

මූලාශ්‍රය : ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

මෙම සහනාධාර වැඩසටහන යටතේ පොහොර සඳහා දැරීමට සිදු වන වියදමින් සියයට 90 ක් පමණ රජය විසින් දරණු ලබන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස පසුගිය දශකය තුළ රසායනික පොහොර ආනයනය සීඝ්‍රයෙන් වර්ධනය වී තිබේ.

රූප සටහන 2.3 : වාර්ෂික පොහොර ආනයනය




මෙසේ අසීමිත ලෙස රසායනික පොහොර ආනයනය හේතුවෙන් සිදු වී ඇති අහිතකර බලපෑම් ලෙස නිදන්ගත වකුගඩු රෝගය, ජලය අපවිත්‍ර වීම හා පස දූෂණය යනාදී විවිධාකාර වූ සාමාජීය හා පාරිසරික ගැටළු හඳුන්වා දිය හැක. මෙයට අමතරව, ගොවීන් රසායනික පොහොර අධිභාවිතය හෝ අවභාවිතයට පෙළඹීම තුළින් මනා කෘෂිකාර්මික ක්‍රමවේදයන්ගෙන් බැහැර වී තිබේ. මෙම වැඩසටහන යටතේ රසායනික පොහොර ඉතා අඩු මිලකට ලබා දීම හේතුවෙන්, ගොවීන් එසේ ඉතා අඩු සහනාධාර මුදලකට ලබා දෙන රසායනික පොහොරට සාපේක්ෂව මිලෙන් වැඩි කාබනික පොහොර භාවිතයෙන් වැළකී සිටීමට පෙළඹී ඇත.

මෙකී පසුබිමක් තුළ, කෘෂිකාර්මික ප්‍රතිපත්ති යටතේ වෙනස් වීමට භාජනය කළ යුතු ප්‍රධානම ප්‍රතිපත්තියක් ලෙස පොහොර සහනාධාර ප්‍රතිපත්තිය රජය විසින් හඳුනා ගන්නා ලදී. ඒ අනුව, දැනට ක්‍රියාත්මක වී පොහොර සහනාධාර වැඩසටහන වෙනස් ක්‍රමවේදයක් මඟින් ප්‍රතිස්ථාපනය කිරීමට පියවර ගන්නා ලද අතර එමඟින් රසායනික පොහොර අවභාවිතය/අධිභාවිතය වැනි අහිතකර බලපෑම් වලින් මිදී පොහොර සහනාධාර වැඩසටහන යටතේ අපේක්ෂිත අරමුණුවලින් බැහැර නොවීමට කටයුතු කර තිබේ.

## 2.4.2 පොහොර සඳහා මුදල් සහනාධාර ලබා දීමේ ප්‍රතිපත්තිය

හුදෙක් සහනාධාරයක් ලෙස පමණක් නොව වී ගොවීන් හට සිය ගොවි යෙදවුම් තෝරා ගැනීම පහසු කරවීම සඳහා වැඩි ඉඩ ප්‍රස්ථා ලබා දීම පිණිස රජය විසින් පොහොර සඳහා මුදල් සහනාධාර ලබා දීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන ලදී. හැරවුම් ලක්ෂයක් ලෙස, 2016 අයවැය යෝජනා මඟින් වාර්ෂිකව හෙක්ටයාරයකට උපරිමය රු. 25,000/- ක් වන පරිදි හෙක්ටයාර දෙකක උපරිම සීමාවක් දක්වා මුදල් සහනාධාරයක් ලබා දීම ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, හෙක්ටයාර දෙකක් හිමි කුඩා පරිමාණ වී ගොවියෙකු වාර්ෂිකව රු. 50,000 ක මුදල් සහනාධාරයකට හිමිකම් කියනු ලබන අතර ඔවුන් යල මහ කන්න දෙකෙහි වෙන් වශයෙන් මෙම සහනාධාර මුදල් ප්‍රතිලාභ හිමිකර ගනු ලබයි.

මෙම නව ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම 2016 යල කන්නයේ සිට ආරම්භ වූ අතර, වී ගොවීන් හට එසේ ලැබුණු සහනාධාර මුදලින් රසායනික පොහොර හෝ කාබනික පොහොර රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ දිවයින පුරා ඇති පොහොර අලෙවි සැල් මඟින් මිල දී ගැනීමේ නිදහස හිමි වී තිබේ. මෙම නව ප්‍රතිපත්තිය සඳහා පහසුකම් සලසාලමින්, පොහොර සමාගම් වී වගාව සඳහා භාවිතා කරනු ලබන ප්‍රධාන පොහොර වර්ග 3 වන යූරියා, ට්‍රිපල් සුපර් පොස්ෆේට් (ටී.එස්.පී.) සහ මියුරියේට් ඔෆ් පොටෑෂ් (එම්.ඕ.පී.) සඳහා කිලෝ ග්‍රෑම් 50 ක පොහොර මිටියකට රු. 2,500/- ක උපරිම සිල්ලර මිලක් පවත්වා ගැනීමට එකඟ විය. පොහොර සහනාධාර මුදල් අදාළ වී ගොවියාගේ බැංකු ගිණුමට සෘජුවම බැර වන අතර එසේ ලබා දුන් මුදල් විස්තර විනිවිදභාවයෙන් යුතුව අන්තර්ජාලය හරහා කෘෂිකර්ම අමාත්‍යාංශ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරනු ලැබේ.

2016 යල කන්නයේ දී, වී ගොවීන් 760,347 ක් සඳහා රු. 6,468,572,147.00 ක මුදලක් පොහොර සඳහා වන මුදල් සහනාධාර වැඩසටහන යටතේ බෙදා දී ඇත.

**වගුව 2.6 : පොහොර සඳහා මුදල් සහනාධාර වැඩසටහනේ ප්‍රගතිය - 2016 යල කන්නය**

| # | දිස්ත්‍රික්කය | මුදල් සහනාධාරය ලබා ගත් ගොවීන් සංඛ්‍යාව | වගා කරන ලද භූමි ප්‍රමාණය (හෙක්ටයාර) | ගෙවූ මුදල් සහනාධාරය (රු.) |
|---|---|---|---|---|
| 1 | කොළඹ | 3,490 | 1,378 | 17,125,600 |
| 2 | ගම්පහ | 16,864 | 6,090 | 80,813,900 |
| 3 | කළුතර | 22,684 | 9,302 | 117,545,750 |
| 4 | මහනුවර | 29,606 | 11,522 | 148,184,250 |
| 5 | මාතලේ | 32,292 | 13,756 | 178,470,750 |
| 6 | නුවර එළිය | 11,971 | 4,823 | 60,712,400 |
| 7 | ගාල්ල | 18,918 | 8,300 | 105,621,750 |
| 8 | මාතර | 25,220 | 13,895 | 177,552,450 |
| 9 | හම්බන්තොට | 45,926 | 35,768 | 448,741,550 |
| 10 | කුරුණෑගල | 143,883 | 73,813 | 940,756,127 |
| 11 | පුත්තලම | 23,465 | 18,732 | 234,804,000 |
| 12 | අනුරාධපුරය | 97,621 | 89,173 | 1,109,084,000 |
| 13 | පොළොන්නරුව | 61,423 | 60,589 | 757,331,000 |
| 14 | බදුල්ල | 41,143 | 20,122 | 255,162,370 |
| 15 | මොණරාගල | 24,283 | 14,616 | 182,934,050 |
| 16 | රත්නපුර | 21,029 | 10,017 | 127,290,950 |
| 17 | කෑගල්ල | 17,151 | 5,036 | 68,627,000 |
| 18 | අම්පාර | 57,392 | 57,639 | 722,083,500 |
| 19 | ත්‍රිකුණාමලය | 22,933 | 21,645 | 271,375,000 |
| 20 | මඩකලපුව | 17,607 | 21,590 | 269,878,250 |
| 21 | වව්නියාව | 3,316 | 2,615 | 32,687,500 |
| 22 | යාපනය | 7,208 | 5,655 | 70,686,250 |
| 23 | මන්නාරම | 6,611 | 2,312 | 28,897,500 |

| | | | | |
|---|---|---|---|---|
| 24 | මුලතිව් | 4,709 | 3,165 | 39,560,000 |
| 25 | කිලිනොච්චිය | 3,602 | 1,670 | 22,646,250 |
| | **එකතුව** | **760,347** | **513,223** | **6,468,572,147** |
| මූලාශ්‍රය : ජාතික පොහොර ලේකම් කාර්යාලය | | | | |

### 2.4.3 අනෙකුත් බෝග සඳහා වන පොහොර සහනාධාර මුදල් වැඩසටහන

කුඩා පරිමාණ ගොවීන් හට ඔවුන්ගේ නිෂ්පාදන පිරිවැය අඩු කිරීම හා වී හැර අනෙකුත් බෝගයන්හි ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා දිරි දීමක් වශයෙන් රජය විසින් කුඩා වතු හිමියන් හා බඩඉරිඟු, සෝයා බෝංචි, අර්තාපල්, ලොකු ලූනු හා මිරිස් වගාවේ නියුතු කුඩා පරිමාණ ගොවීන් සඳහා පොහොර මුදල් සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙකී වගාවන් පහ තෝරා ගෙන ඇත්තේ රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන "ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන" හා සමගාමීවය. වී හැර අනෙකුත් බෝග සඳහා වන වාර්ෂික පොහොර සහනාධාර මුදල් ප්‍රමාණයන් පහත වගුවේ දැක්වේ.

වගුව 2.7 : වැවිලි බෝග හා අනෙකුත් බෝග සඳහා වාර්ෂික සහනාධාර මුදල් සීමා

| බෝගය | සහනාධාර මුදල් ලැබීමට අදාළ උපරිම භූමි ප්‍රමාණය (හෙක්ටයාර) | ගෙවනු ලබන වාර්ෂික සහනාධාර මුදල (රු.) |
|---|---|---|
| තේ | 01 | 15,000 |
| රබර් | 02 | 5,000 |
| පොල් | 02 | 9,000 |
| බඩඉරිඟු, සෝයා බෝංචි, අර්තාපල්, ලොකු ලූනු හා මිරිස් | 01 | 10,000 |
| මූලාශ්‍රය : කෘෂිකර්ම අමාත්‍යාංශය හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | | |

2016 වර්ෂයේ දී වැවිලි අංශයේ කුඩා වතු හිමියන් 318,032 ක් පමණ සහනාධාර මුදල් ලබා ගන්නා ලදී.

වගුව 2.8 : වැවිලි බෝග සඳහා සහනාධාර මුදල් ලබා දීමේ ප්‍රගතිය -2016

| වැවිලි බෝගය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වගා කරනු ලැබූ භූමි ප්‍රමාණය (හෙක්ටයාර) | ගෙවූ සහනාධාර මුදල (රු.) |
|---|---|---|---|
| තේ | 207,176 | 84,884 | 1,273 |
| රබර් | 38,472 | 18,220 | 91 |
| පොල් | 72,384 | 55,245 | 495 |
| **එකතුව** | **318,032** | **158,349** | **1,859** |
| මූලාශ්‍රය : වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | | | |

2016 වර්ෂයේ දී බඩඉරිඟු, සෝයා බෝංචි, අර්තාපල්, ලොකු ලූනු හා මිරිස් වගා කරනු ලබන කුඩා ගොවීන් 41,931 ක් පමණ සහනාධාර මුදල් ලබා ගන්නා ලදී.

වගුව 2.9 : අනෙකුත් බෝග සඳහා සහනාධාර මුදල් ලබා දීමේ ප්‍රගතිය - 2016

| # | පළාත | සහනාධාර මුදල් ලබා ගත් ගොවීන් සංඛ්‍යාව | වගා කරනු ලැබූ භූමි ප්‍රමාණය (හෙක්ටයාර) | ගෙවූ සහනාධාර මුදල (රු.) |
|---|---|---|---|---|
| 1 | බස්නාහිර | 1 | 0.40 | 4,000.00 |
| 2 | මධ්‍යම | 3,056 | 938.03 | 9,629,000.00 |
| 3 | දකුණ | 229 | 121.50 | 1,215,000.00 |
| 4 | වයඹ | 4,068 | 2,707.93 | 27,077,500.00 |
| 5 | උතුරු මැද | 5,707 | 3,692.16 | 36,941,000.00 |
| 6 | ඌව | 14,484 | 9,285.82 | 93,221,600.00 |
| 7 | සබරගමුව | 96 | 39.10 | 391,000.00 |
| 8 | නැගෙනහිර | 7,682 | 6,743.70 | 67,388,000.00 |
| 9 | උතුර | 6,608 | 2,626.92 | 27,687,000.00 |
| **එකතුව** | | **41,931** | **26,155.56** | **263,554,100.00** |
| මූලාශ්‍රය : ජාතික පොහොර ලේකම් කාර්යාලය | | | | |

### 2.4.4 නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය

කෘෂිකාර්මික අංශයට ණය පහසුකම් සපයමින්, ග්‍රාමීය අංශයේ නිෂ්පාදනයන් දිරි ගන්වමින් හා එම ජනතාවගේ ජීවන තත්ත්වයන් නඟා සිටුවීමේ අරමුණින් නව සපිරි ග්‍රාමීය ණය යෝජනා

ක්‍රමය 2016 වසර තුළදී ද ක්‍රියාත්මක විය. ගොවීන්, කෘෂි නිෂ්පාදන මිල දී ගන්නන් හා කෘෂිකර්මය මත පදනම් වූ කර්මාන්තකරුවන්ගේ ඉහළ ඉල්ලුම මෙන්ම සහභාගීත්ව මූල්‍ය ආයතනවල කැමැත්ත මෙම ණය යෝජනා ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට රුකුලක් විය. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දෙන වගා ණයවලින් බහුතරයක් උපයෝජනය කරනු ලබන්නේ සුළු පරිමාණ ගොවීන්ය. වගා කටයුතු සඳහා ගොවීන්ට සියයට 7 ක පොළී අනුපාතයකට ණය ලබා දෙන අතර ඒ සඳහා සියයට 5 ක පොළී සහනාධාරයක් ද රජය විසින් ලබා දේ. වී, මිරිස්, බඩ ඉරිඟු, ලොකු ලූණු, අර්තාපල් හා එළවළු ද ඇතුළත්ව අනෙකුත් බෝග වර්ග 33 ක් සඳහා මෙම යෝජනා ක්‍රමය යටතේ ණය ලබා දෙනු ලැබේ. මහා භාණ්ඩාගාරය විසින් 2016 වසර තුළ රු. මිලියන 210 ක් පොළී සහනාධාර ලෙස ණය ලබා දෙන බැංකු වෙත නිදහස් කර ඇත.


**වගුව 2.10 : නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් ණය - 2016**

| බෝගය | උපරිම ණය සීමාව (රු.) | උපරිම භූමි ප්‍රමාණය (අක්කර) | ප්‍රදානය කළ ණය ප්‍රමාණය | ප්‍රදානය කළ ණය මුදල (රු. මිලියන) | භූමි වපසරිය (අක්කර) |
|---|---|---|---|---|---|
| වී - | | | | | |
| වාරිමාර්ග | 300,000 | 10 | 56,884 | 5,006 | 201,932 |
| වර්ෂා පෝෂිත | 320,000 | 10 | | | |
| බඩ ඉරිඟු | 340,000 | 10 | 8,877 | 684 | 27,032 |
| අර්තාපල් | 504,000 | 2 | 3,150 | 526 | 4,283 |
| ලූනු | 280,000 | 2 | 6,335 | 803 | 11,309 |
| මිරිස් | 176,000 | 2 | 3,728 | 256 | 6,760 |
| එළවළු | 62,000-238,000 | 2 | 4,753 | 436 | 12,587 |
| වෙනත් - ඉඟුරු | 140,000 | 2 | 3,333 | 298 | 11,094 |
| **එකතුව** | | | **87,060** | **8,009** | **274,997** |

මූලාශ්‍රය : ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

රට තුළ පැවති යහපත් ආර්ථික තත්ත්වය හා යහපත් පාරිසරික තත්ත්වයන් හේතුවෙන් 2016 වර්ෂයේ මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ඉල්ලුම වැඩි විය. නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලැබූ ගොවීන් සංඛ්‍යාව 2014 වර්ෂය හා සැසඳීමේ දී, 2016 වර්ෂයේ දී 86,143 සිට 87,060 දක්වා වැඩි වී ඇති අතර මුළු ණය ප්‍රදානයන් 2015 වර්ෂයේ දී රු. මිලියන 7,138 සිට 2016 වර්ෂයේ දී රු. මිලියන 8,009 දක්වා වැඩි විය. ප්‍රදානය කර ඇති ණය ප්‍රමාණය අනුව, අක්කරයකට රු. 320,000 ක උපරිමයකට යටත්ව වී වගාකරුවන්ට වැඩිම ණය ප්‍රමාණයක් නිදහස් කර ඇති අතර එය 2016 වර්ෂය තුළ ප්‍රදානිත ණය ප්‍රමාණයෙන් සියයට 62 කි. 2016 වසර තුළ මෙම ණය පහසුකම් යටතේ අක්කර 274,997 ක කෘෂි බෝග වගා කර ඇති අතර එයින් සියයට 73 ක් වී වගාව සඳහා යොදා ගෙන ඇත.

**රූප සටහන 2.4 : 2016 වසරේ නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රදානිත ණය - දිස්ත්‍රික්ක අනුව**





2016 වසර තුළ ලබා දී ඇති මුළු ණය ප්‍රමාණය හා ප්‍රතිලාභීන්ගේ ප්‍රාදේශීය ව්‍යාප්තිය සැලකීමේ දී මුළු ණය ප්‍රමාණය වන රු. මිලියන 8,009 කින් සියයට 17 ක ප්‍රමාණය වන රු. මිලියන 1,365 ක් අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. එමෙන්ම, අනෙකුත් දිස්ත්‍රික්කවලට සාපේක්ෂව බලන

කළ පොළොන්නරුව, හම්බන්තොට, මාතලේ, අම්පාර, හා බදුල්ල දිස්ත්‍රික්කවල ද මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව ඉහළ අගයක් පෙන්නුම් කරයි.

### 2.4.5 'කෙතට අරුණ පොහොර දිරිය' වගා රක්ෂණ යෝජනා ක්‍රමය

නියඟ, ගං වතුර හා වන අලින්ගෙන් වගාවන්ට සිදු වන හානි සඳහා සහන සැලසීමේ අරමුණින් පිහිටුවන ලද 'කෙතට අරුණ පොහොර දිරිය' වගා රක්ෂණ යෝජනා ක්‍රමය අඛණ්ඩව 2016 වර්ෂයේදී ද කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය හරහා සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. 2016 වර්ෂය තුළදී දළ වශයෙන් රු. මිලියන 262 ක මුදලක් ගොවීන් 44,367 දෙනෙකු අතර වගා හානි සඳහා ලබා දී ඇත.


රූප සටහන 2.5 : 'කෙතට අරුණ පොහොර දිරිය' වගා රක්ෂණ යෝජනා ක්‍රමයේ ප්‍රගතිය - 2016




### 2.4.6 ගොවීන් සඳහා වූ සමාජ ආරක්ෂණය

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ප්‍රධාන අරමුණ වනුයේ රටේ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ඔවුන්ගේ තරුණ අවධිය කැප කළ වැඩිහිටි ගොවි ජනතාවගේ යහපැවැත්ම තහවුරු කිරීමයි. මෙම යෝජනා ක්‍රමය කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. 2016 වර්ෂය අවසන් වන විට 141,260 ක් පමණ වූ වැඩිහිටි ගොවීන් සංඛ්‍යාවක් මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලැබූ අතර, රු. මිලියන 2,695 ක මුදලක් 2016 වර්ෂය තුළ දී ඔවුන් අතර බෙදා දෙන ලදී. මෙම ගොවි විශ්‍රාම වැටුප් අරමුදල සතුව ස්වාධීනව ක්‍රියාත්මක වීමට ප්‍රමාණවත් මූල්‍ය ශක්තියක් නොමැති බැවින් ගොවි විශ්‍රාම වැටුප නිසි කළට ලබා දීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් මාසිකව රු. මිලියන 205 ක මුදලක් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත ලබා දෙන ලදී. මේ වන විට මෙම විශ්‍රාම වැටුප් ක්‍රමයට සුදුසුකම් ලැබූ ගොවීන් සෑම මසකම පළමු සතිය තුළ දී තැපැල් කාර්යාල හරහා තම විශ්‍රාම වැටුප ලබා ගනී.

රූප සටහන 2.6 : ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයේ ප්‍රගතිය - 2016



## 2.5 කුඩා පරිමාණ වැවිලි කර්මාන්ත අංශය සඳහා දක්වන ලද සහාය

ප්‍රධාන විදේශ විනිමය උපයන්නෙකු ලෙස දක්වන සුවිශේෂී දායකත්වය හේතුවෙන් වැවිලි කර්මාන්ත අංශයේ මනා ක්‍රියාකාරීත්වය රටට ඉතා වැදගත් වේ. එම නිසා, නිදහසින් පසු බලයට පැමිණි සියළුම රජයන් වැවිලි කර්මාන්ත අංශයේ නිසි ක්‍රියාකාරීත්වයට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා කාලීන ක්‍රියාමාර්ග ගන්නා ලදී. ඒ අනුව, කුඩා පරිමාණ වැවිලි කර්මාන්ත අංශය දිරිගැන්වීම වෙනුවෙන් දිරිදීමනා සහ සහනාධාර විශාල වශයෙන් ලබා දුන් වර්ෂයක් ලෙස 2016 වර්ෂය හඳුන්වා දිය හැක.

වැවිලි කර්මාන්ත අංශය දළ දේශීය නිෂ්පාදිතයට (ද.දේ.නි.) සියයට 1.9 ක සහ සමස්ත අපනයනයන්ට සියයට 17.5 දායකත්වයක් සපයයි. වර්තමානයේදී, වැවිලි කර්මාන්ත අංශය කෙරෙහි වැඩි දායකත්වයක් සපයනුයේ කුඩා පරිමාණයේ වැවිලිකරුවන් වන අතර, අක්කර 10 ට අඩු තේ හා රබර් වතු වගාකරුවන් හා අක්කර 5 ට අඩු පොල් වගාකරුවන් මෙම කුඩා පරිමාණ වැවිලිකරුවන් යටතට ගැනේ. තවද, මෙම කුඩා පරිමාණ වැවිලි කර්මාන්ත අංශය සමස්ත තේ නිෂ්පාදනයෙන් සියයට 72 කට, සමස්ත රබර් නිෂ්පාදනයෙන් සියයට 65 කට හා සමස්ත පොල් නිෂ්පාදනයෙන් සියයට 82 කට ද දායකත්වය සපයයි.

**වගුව 2.11 : කුඩා පරිමාණ වැවිලි කර්මාන්ත අංශයේ ක්‍රියාකාරීත්වය, 2010 - 2016**

| වර්ෂය | තේ | | රබර් | | පොල් | |
|---|---|---|---|---|---|---|
| | භූමි ප්‍රමාණය (හෙක්.) | මුළු නිෂ්පාදනය (කි. ග්‍රෑම් මිලියන) | භූමි ප්‍රමාණය (හෙක්.) | මුළු නිෂ්පාදනය (කි. ග්‍රෑම් මිලියන) | භූමි ප්‍රමාණය (හෙක්.) | මුළු නිෂ්පාදනය (ගෙඩි මිලියන) |
| 2010 | 204,619 | 331 | 125,645 | 153 | 394,836 | 1,900 |
| 2011 | 206,104 | 328 | 128,120 | 158 | 394,836 | 2,303 |
| 2012 | 203,020 | 328 | 130,780 | 152 | 394,836 | 2,411 |
| 2013 | 202,408 | 340 | 133,668 | 130 | 394,836 | 2,061 |
| 2014 | 202,800 | 338 | 134,137 | 99 | 394,836 | 2,890 |
| 2015 | 202,800 | 329 | 134,906 | 89 | 394,836 | 3,027 |
| 2016 | 202,490 | 292 | 133,500 | 79 | 440,000 | 3,098 |

මූලාශ්‍රය : වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### 2.5.1 කුඩා පරිමාණ වැවිලි කර්මාන්ත අංශය සඳහා ලබා දෙන නැවත වගා සහ නව වගා සහනාධාරය

කුඩා පරිමාණ වැවිලි අංශය දිරිමත් කිරීම සඳහා රජය අඛණ්ඩව තේ හා රබර් නැවත වගා කිරීම සහ නව වගාවන් සඳහා දිරි දීමනා ලබා දෙයි. ඒ අනුව, තේ නැවත වගාව සහ නව වගාවන් සඳහා සහනාධාර ලෙස පිළිවෙලින් හෙක්ටයාරයකට රු. 500,000 ක් සහ රු. 400,000 ක් බැගින් ලබා දෙන ලදී. තවද, රබර් නැවත වගාව සහ නව වගාවන් සඳහා සහනාධාරය ලෙස පිළිවෙලින් හෙක්ටයාරයකට රු. 175,000 සහ රු. 150,000 ක් බැගින් ද ලබා දෙන ලදී.

2016 වර්ෂයේ දී කුඩා පරිමාණ වගාකරුවන් සඳහා තේ සහ රබර් නැවත වගාව සහ නව වගාව සඳහා සහනාධාරය ලෙස රු. මිලියන 905 ක පමණ මුදලක් රජය විසින් සපයා ඇත. මෙම වර්ෂයේ දී ප්‍රතිලාභීන් 30,965 කට මෙම සහනාධාරය ලබා ඇති අතර, 2015 වර්ෂය හා සලකා බලන විට එය සියයට 29.5 ක ඉහළ යාමකි.

**වගුව 2.12 : කුඩා පරිමාණ තේ සහ රබර් වතු අංශය සඳහා නැවත වගා සහ නව වගා සඳහා ලබා දී ඇති සහනාධාරවල ප්‍රගතිය**

| වර්ෂය | නැවත වගා සහනාධාරය | | | | නව වගා සහනාධාරය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | තේ | | රබර් | | තේ | | රබර් | |
| | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | සහනාධාර මුදල (රු. මිලියන) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | සහනාධාර මුදල (රු. මිලියන) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | සහනාධාර මුදල (රු. මිලියන) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | සහනාධාර මුදල (රු. මිලියන) |
| 2012 | 28,133 | 226.83 | 1,702 | 95.73 | 3,319 | 23.20 | 2,374 | 125.43 |
| 2013 | 30,955 | 351.87 | 2,622 | 171.31 | 3,759 | 42.41 | 2,938 | 167.73 |
| 2014 | 16,555 | 258.09 | 2,004 | 219.07 | 3,381 | 66.98 | 2,247 | 213.47 |
| 2015 | 17,252 | 420.07 | 852 | 173.36 | 4,732 | 128.12 | 1,076 | 189.83 |
| 2016 | 23,840 | 484.03 | 942 | 192.98 | 5,363 | 48.28 | 820 | 179.90 |

මූලාශ්‍රය : වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

### 2.5.2 ලියාපදිංචි තේ කර්මාන්ත ශාලා හිමියන් සඳහා වන කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය

තේ කර්මාන්ත ශාලා හිමියන්ට ඔවුන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා 2015 වර්ෂයේ දී දියත් කරන ලද මෙම ණය යෝජනා ක්‍රමය 2016 වර්ෂයේ දී තවදුරටත් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වාණිජ බැංකු හරහා මෙම ණය යෝජනා ක්‍රමය කෙටි කාලීන පදනම මත ක්‍රියාත්මක කරනු ලැබේ.

ණය සඳහා වාර්ෂික පොළී අනුපාතය සියයට 6 ක් වන අතර ශ්‍රී ලංකා රජය විසින් සියයට 2 ක පොළී සහනාධාරයක් බැංකු වෙත ලබා දෙනු ලැබේ. මෙම පොළී සහනාධාරය ගෙවීම සඳහා රජය විසින් රු. මිලියන 516 ක මුදලක් 2016 - 2017 වර්ෂ සඳහා වෙන් කරනු ලැබ ඇත.

2016 වර්ෂයේ දී කාරක ප්‍රාග්ධන ණය 219 ක් තේ කර්මාන්ත ශාලා හිමියන් වෙත ප්‍රදානය කර ඇති අතර, එහි වටිනාකම රු. මිලියන 6,959 කි. ප්‍රදානය කරන ලද ණය පහසුකම් සංඛ්‍යාව මත සලකා බලන විට, 2015 වර්ෂයේ දී ණය 69 ක් ද, 2016 වර්ෂයේ දී ණය ප්‍රදාන 219 කුත් ප්‍රදානය කරමින් සියයට 217 ක ණය ප්‍රදාන වැඩි වීමක් පෙන්නුම් කරනු ලබයි.

2016 වර්ෂයේ දී රජය විසින් රු. මිලියන 114.4 ක පමණ මුදලක් පොළී සහනාධාර වශයෙන් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ප්‍රතිපූර්ණය කරන ලදී.


වගුව 2.13 : කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමයේ ප්‍රගතිය - 2016

| විස්තරය | ප්‍රතිලාභ ලැබූ තේ කර්මාන්ත ශාලා සංඛ්‍යාව | ගෙවනු ලැබූ පොළී සහනාධාරය (රු. මිලියන) |
|---|---|---|
| 1 කාර්තුව | 154 | 24.54 |
| 2 කාර්තුව | 190 | 28.00 |
| 3 කාර්තුව | 213 | 33.30 |
| 4 කාර්තුව | 219 | 28.56 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව


### 2.5.3 ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්තය සඳහා වන සංවර්ධන ප්‍රතිපත්ති

ශ්‍රී ලංකාවේ වාර්ෂික සීනි අවශ්‍යතාවය (පුද්ගල පරිභෝජනය, රස කැවිලි නිෂ්පාදනය සහ අනෙකුත් සීනි ආශ්‍රිත කර්මාන්ත සඳහා) ආසන්න වශයෙන් මෙ.ටො. 720,000 ක් (මාසිකව මෙ.ටො. 60,000) පමණ වන අතර වර්තමාන දේශීය නිෂ්පාදනය මෙ.ටො. 56,000 ක් ද වන අතර එය සමස්ත වාර්ෂික අවශ්‍යතාවයෙන් සියයට 8 කි. එම නිසා, වාර්ෂිකව සීනි මෙ.ටො. 650,000 ක් එනම්, වාර්ෂික අවශ්‍යතාවයෙන් සියයට 92 ක් ආනයනය කිරීමට රු. බිලියන 35 ක විදේශ විනිමය ප්‍රමාණයක් වාර්ෂිකව විදේශයන්ට ගලා යෑමක් සිදුවේ.



වර්ෂ 2016 දී ලෝක වෙළඳපොල තුළ සීනි මිල ඉහළ යාමේ ප්‍රවණතාවයක් දක්නට ලදී. මේ හේතුවෙන් දේශීය වෙළඳපොල තුළ වසර මැද දී සීනි කි. ග්‍රෑමයක මිල රු. 120/- දක්වා ඉහළ යන ලදී. මෙයට පිළියමක් ලෙස රජය මැදිහත් වී උපරිම සිල්ලර මිලක්, එනම් කි. ග්‍රෑමයක මිල රු. 95/- දක්වා ගෙන ඒම සඳහා සීනි සඳහා වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අඩු කරමින් දේශීය වෙළඳපොල තුළ සහනාදායී සිල්ලර මිලක් ඇති කරන ලදී.

කෙසේ වෙතත්, වර්ෂය අග භාගයේ දී ලෝක වෙළඳපොල මිල ගණන් පහළ යන ලද අතර විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද විටින් විට වෙනස් කරන ලද්දේ ලෝක වෙළඳපොල මිල පහළ යාම යොදා ගනිමින් රජයේ ආදායම ඉහළ දමන අතරම පාරිභෝගිකයාට සහනදායී සිල්ලර මිලක් ලබා දීමටය.




දළ දේශීය නිෂ්පාදනයට, සේවා නියුක්තියට සහ ආහාර හා බලශක්ති සුරක්ෂිතතාවයට මෙන්ම දිළිඳුකම තුරන් කිරීමට ද දායක විය හැකි ඉහළ විභවතාවයක් දේශීය සීනි කර්මාන්තය සතුවේ. විශාල වශයෙන් විදේශයට ඇදී යන මුදල් ප්‍රමාණය රට තුළ ආයෝජනය කළ හැකි නම් එමගින් නොදියුණු ප්‍රදේශ දියුණු කළ හැකි වන අතර ජනතාවගේ ආර්ථික තත්ත්වයේ ඉහළ යාමක් ද අපේක්ෂා කළ හැක.

ඉහත කරුණු සලකා බලා වර්ෂ 2016 දී "සීනි කර්මාන්තය සඳහා වන සංවර්ධන ප්‍රතිපත්ති" ප්‍රකාශය ප්‍රතිපත්ති නිර්ණායක හතක් සහ ඒ සඳහා වන සංයුක්ත උපායමාර්ග ද ඇතුළත්ව එළි දක්වන ලදී. මෙම නිර්ණායක අතර ආයතනික ප්‍රතිපත්ති, ආයෝජන ප්‍රතිපත්ති, නිෂ්පාදන හා ඉඩම් ප්‍රතිපත්ති, මිල ප්‍රතිපත්ති, ආනයන ප්‍රතිපත්ති, ජල සම්පත් හා යටිතල පහසුකම් සංවර්ධන ප්‍රතිපත්ති, සහ මිනිස් බල දියුණු කිරීමේ ප්‍රතිපත්ති වේ.

ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා වන ඉලක්ක අනුව පවතින සීනි කර්මාන්ත ශාලා නවීකරණය කිරීම, උක් වැවීමේ කර්මාන්තය ප්‍රතිෂ්ඨාපනය කිරීම සහ නව සීනි සැකසුම් සංකීර්ණය ස්ථාපිත කිරීම, එම වගාව සඳහා වන සුදුසු දේශගුණික සහ කාලගුණික තත්ත්ව ඇති ග්‍රාමීය ප්‍රදේශවල පිහිටුවීම තුළින් සීනි කර්මාන්තයෙහි සියයට 50 ක ස්වයංපෝෂිත තත්ත්වයක් වර්ෂ 2020 දී ළඟා කර ගැනීමට අපේක්ෂා කෙරේ.


## 2.6 ආහාර සුරක්ෂිතතාවය

### 2.6.1 රජයේ වී මිල දී ගැනීමේ වැඩසටහන

රටේ ප්‍රධාන ආහාරය සහල් වන බැවින් ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව වී වගාව වටා කේන්ද්‍රගත වී ඇත. ඒ අනුව, පෙර සිදු කරගෙන පැමිණි පරිදිම 2016 වර්ෂය තුළ දීත් යෙදවුම් සහනාධාර ලබා දීම, වී සඳහා රජයේ සහතික මිලක් ලබා දීම, සහනදායී පොළී අනුපාතික යටතේ වූ වගා ණය, තාක්ෂණික හා ව්‍යාප්ති සේවා මගින් රජය විසින් වී වගා කිරීම දිරිමත් කරන ලදී.

2016 වර්ෂයේ වාර්ෂික වී නිෂ්පාදනය මෙ.ටො. මිලියන 4.42 ලෙස වාර්තා විය. කෙසේ වුවද, 2015 වර්ෂයේ දී වාර්තා වූ මෙ.ටො. මිලියන 4.81 ක වී නිෂ්පාදනය තවදුරටත් මෙතෙක් වාර්තා වූ වැඩිම වාර්ෂික වී නිෂ්පාදනය ලෙස පවතී (මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව).

රූප සටහන 2.9 : වාර්ෂික වී නිෂ්පාදනය 2000 - 2016




2016 රජයේ වී මිල දී ගැනීමේ වැඩසටහන ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය විසින් වී අලෙවි මණ්ඩලය හරහා ක්‍රියාත්මක කරන ලදී. වී අලෙවි මණ්ඩලය 2016 වර්ෂය තුළ රු. මිලියන 6,195 ක් වැය කරමින් වී මෙ.ටො. 157,419 ක් මිල දී ගන්නා ලදී. මෙයින් රු. මිලියන 5,139 ක් 2015/16 මහ කන්නයේ දී යොදා ගත් අතර මිල දී ගත් වී ප්‍රමාණය මෙ.ටො. 131,981 කි. 2016 යල කන්නයේ දී රට තුළ පැවති නියං තත්ත්වය දේශීය වී නිෂ්පාදනය මත අහිතකර බලපෑම් ඇති කරන ලදී. නිෂ්පාදනය පහත වැටීම හේතුවෙන් 2016 යල කන්නය තුළ වී සඳහා ස්ථාවර මිලක් පවත්වා ගැනීම අභියෝගාත්මක නොවීය. ඒ අනුව, රජයේ වී මිල දී ගැනීමේ වැඩසටහන යටතේ රු. මිලියන 1,056 ක් වැය කරමින් වී මෙ.ටො. 25,438 ක් පමණක් මිල දී ගන්නා ලදී.

2015 යල කන්නය අවසන් වන විට වී සඳහා පැවති සහතික මිල සමාලෝචනය කිරීමෙන් පසු, නිෂ්පාදන පිරිවැය, සහල් සඳහා අපේක්ෂිත පාරිභෝගික මිල හා රජයේ වී මිල දී ගැනීමේ වැඩසටහනේ අක්‍රමිකතා ඇති වීමේ අවස්ථා අධෛර්යමත් කරන අතරම වී බැහැර කිරීමේ අදියරේ දී සිදු විය හැකි අලාභයන් වළක්වා ගැනීමත් වැනි කරුණු රාශියක් පිළිබඳ අවධානය යොමු කරන ලදී. ඒ අනුව, කීරි සම්බා වී සඳහා කිලෝවකට රු. 50/- ක්, සම්බා වී සඳහා කිලෝවකට රු. 41/- ක් සහ නාඩු වී සඳහා කිලෝවකට රු. 38/- ක් ලෙස වී ගැණුම් මිල සංශෝධනය කිරීමට යෝජනා විය. මෙම සංශෝධිත මිල ගණන් 2016 වර්ෂය තුළ රජයේ වී මිල දී ගැනීමේ වැඩසටහන සඳහා බලපවත්වන ලදී.

ක්‍රමයෙන් රජයේ වී මිල දී ගැනීමේ වැඩසටහන වඩාත් විනිවිදභාවයෙන් යුතු සහ අවදානම් අවම කිරීමට රජය විසින් අවශ්‍ය පෙර කටයුතු සිදු කරන ලදී. "වී අලෙවි මණ්ඩලය මුහුණපාන ගැටළු සම්බන්ධයෙන් කාලෝචිත විසඳුම් ලබා දීමටත් වී අලෙවි මණ්ඩලය වෙත සහාය ලබා දීම සඳහාත් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ඉහළ බලතල සහිත කමිටුව" විසින් වී මිල දී ගැනීම සඳහා අදාළ කොන්දේසි සමාලෝචනය කර වී මිල දී ගැනීමේ වැඩසටහන විධිමත් කිරීම සඳහා නව පියවරයන් හඳුන්වා දෙන ලදී. ඒ අනුව, රජයේ වී මිල දී ගැනීමේ වැඩසටහනේ අක්‍රමිකතා සිදු වීමේ අවස්ථාවන් අවම කරන අතරම එම වැඩසටහනේ විනිවිදභාවය වැඩි දියුණු කිරීමේ අරමුණින් වී අලෙවි මණ්ඩලය ඔවුන්ගේ වෙබ් අඩවිය හරහා ගොවීන් ලියාපදිංචි කර ගන්නා ලදී. ඉහළ බලතල සහිත කමිටුවේ මඟ පෙන්වීම යටතේ වී අලෙවි මණ්ඩලය විසින් වී බැහැර කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. වී බැහැර කිරීමේ ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාදාමයට අනුව තෝරාගත් ලියාපදිංචිගත වූ වී මෝල් හිමියන් ලැයිස්තුවක් පවත්වා ගැනීමේ ක්‍රමයක් මෙම කමිටුව විසින් ආරම්භ කරන ලදී. ඒ අනුව, වී අලෙවි මණ්ඩලය සතුව තිබූ මෙ.ටො. 335,890 ක් පමණ වූ මුළු වී තොගයෙන් මෙ.ටො. 254,219 ක පමණ ප්‍රමාණයක් 2016 වර්ෂය අවසන් වන විට බැහැර කිරීමට හැකි විය. ඉහළ බලතල සහිත කමිටුවේ නිර්දේශ මත 2016 වර්ෂයේ ප්‍රථම වතාවට වී අලෙවි මණ්ඩලයේ වී තොග ලාභයක් ලැබෙන පරිදි බැහැර කිරීමට හැකි විය.

කෙසේ වුවද, වී වල සහතික මිලට අමතරව වී මිල දී ගැනීම සඳහා අදාළ වූ අනෙකුත් කොන්දේසි 2016 වර්ෂය සඳහා ද නොවෙනස්ව පැවතුණි. එමනිසා, පසුගිය කන්නවලට සාපේක්ෂව රජයේ සැලකිය යුතු මැදිහත් වීමක් අවශ්‍ය නොවුණි.

**වගුව 2.14 : රජයේ වී මිල දී ගැනීමේ වැඩසටහන යටතේ මිල දී ගත් වී ප්‍රමාණය**

| කන්නය | නාඩු (මෙ.ටො.) | සම්බා (මෙ.ටො.) | එකතුව (මෙ.ටො.) | වටිනාකම (රු. මිලියන) |
|---|---|---|---|---|
| 2009/10 මහ | 63,850 | 6,919 | 70,769 | 1,995 |
| 2010 යල | 83,819 | 27,910 | 111,729 | 3,184 |
| **උප එකතුව** | **147,669** | **34,829** | **182,498** | **5,179** |
| 2010/11 මහ | 2,913 | 556 | 3,469 | 98 |
| 2011 යල | 58,967 | 16,205 | 75,172 | 2,137 |
| **උප එකතුව** | **61,880** | **16,761** | **78,641** | **2,235** |
| 2011/12 මහ | 107,319 | 8,467 | 115,786 | 3,259 |
| 2012 යල | 9,936 | 540 | 10,476 | 294 |
| **උප එකතුව** | **117,255** | **9,007** | **126,262** | **3,553** |
| 2012/13 මහ | 107,445 | 31,205 | 138,650 | 4,530 |
| 2013 යල | 81,834 | 12,542 | 94,376 | 3,058 |
| **උප එකතුව** | **189,279** | **43,747** | **233,026** | **7,588** |
| 2013/14 මහ | 3,971 | 592 | 4,563 | 148 |
| 2014 යල | 0 | 0 | 0 | 0 |
| **උප එකතුව** | **3,971** | **592** | **4,563** | **148** |
| 2014/15 මහ | 126,203 | 34,366 | 160,569 | 7,510 |
| 2015 යල | 162,526 | 12,487 | 175,013 | 7,950 |
| **උප එකතුව** | **288,729** | **46,853** | **335,582** | **15,460** |
| 2015/16 මහ | 91,785 | 40,196 | 131,981 | 5,139 |
| 2016 යල | 11,054 | 14,384 | 25,438 | 1,056 |
| **උප එකතුව** | **102,839** | **54,580** | **157,419** | **6,195** |
| **මුළු එකතුව** | **911,622** | **206,369** | **1,117,991** | **40,358** |

මූලාශ්‍රය : වී අලෙවි මණ්ඩලය

**රූප සටහන 2.15 : පෞද්ගලික අංශයට වී මිල දී ගැනීම සඳහා ලබා දුන් ණය - 2016**

| | 2015/16 මහ | | 2016 යල | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| බැංකුව | ණය සංඛ්‍යාව | මුළු මුදල (රු. මිලියන) | ණය සංඛ්‍යාව | මුළු මුදල (රු. මිලියන) | ණය සංඛ්‍යාව | මුළු මුදල (රු. මිලියන) |
| මහජන බැංකුව | 130 | 1,141.00 | 106 | 1,955.00 | 236 | 3,096.00 |
| ලංකා බැංකුව | 400 | 15,524.45 | 377 | 11,552.15 | 777 | 27,076.60 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 4 | 29.70 | 44 | 141.25 | 48 | 170.95 |
| **රාජ්‍ය බැංකුවල එකතුව** | **534** | **16,695.15** | **527** | **13,648.40** | **1,061** | **30,343.55** |
| කොමර්ෂල් බැංකුව | 45 | 137.43 | 88 | 1,561.15 | 133 | 1,698.58 |
| සම්පත් බැංකුව | 179 | 2,782.70 | 186 | 2,824.20 | 365 | 5,606.90 |
| ඩී.එෆ්.සී.සී. බැංකුව | 21 | 817.70 | 16 | 455.75 | 37 | 1,273.45 |
| සෙලාන් බැංකුව | 132 | 325.97 | 84 | 490.39 | 216 | 816.36 |
| ජාතික සංවර්ධන බැංකුව | 97 | 732.36 | 102 | 725.23 | 199 | 1,457.59 |
| හැටන් නැෂනල් බැංකුව | 137 | 1,259.50 | 117 | 1,187.20 | 254 | 2,446.70 |
| **පෞද්ගලික බැංකුවල එකතුව** | **611** | **6,055ශ66** | **593** | **7,243.92** | **1,204** | **13,299.58** |
| **මුළු එකතුව** | **1,145** | **22,750.81** | **1,120** | **20,892.32** | **2,265** | **43,643.13** |

මූලාශ්‍රය : අදාළ බැංකු

2016 වර්ෂය තුළ රාජ්‍ය බැංකු මෙන්ම පෞද්ගලික බැංකු ද රු. මිලියන 43,643 ක් වටිනා ඔඩපණ ණය ලබා දීමෙන් පෞද්ගලික අංශයේ වී මිල දී ගැනීමට සහාය දක්වන ලදී. 2015 වර්ෂයේ දී ලබා දුන් රු. මිලියන 34,440 ක මුදලට සාපේක්ෂව මෙය සියයට 27 ක පමණ වැඩි වීමකි. 2015/16 මහ කන්නයේ සැලකිය යුතු ඉහළ අස්වැන්නත්, සංශෝධිත රජයේ සහතික වී මිලත් මධ්‍යයේ වුවද පෞද්ගලික අංශයේ දායකත්වය වැඩි වීම ගොවියාට සාධාරණ මිලක් සහතික කිරීමේ කාර්යයට පහසුවක් විය.

2016 වර්ෂය තුළ පෞද්ගලික අංශයට ලබා දුන් සමස්ත ඔඩපණ ණය ප්‍රමාණයෙන් සියයට 70 ක් පමණ වූ විශාල ප්‍රමාණයක් රාජ්‍ය බැංකුවලින් ලබා දී තිබුණි. ඉතිරි සියයට 30 ක පමණ ප්‍රමාණය පෞද්ගලික බැංකුවලින් ලබා දී ඇත. තවද, ලබා දුන් ණය සංඛ්‍යාව 2015 දී ලබා දුන් 1,831 ක ප්‍රමාණයේ සිට 2016 දී 2,265 දක්වා වැඩි සංඛ්‍යාවක් වීමෙන් පෞද්ගලික අංශයේ වී මිල දී ගන්නන්ගේ වැඩි වූ දායකත්වයක් පෙන්නුම් කරයි.

### 2.6.2 ලෝක ආහාර වැඩසටහනට සහල් පරිත්‍යාග කිරීම.

2016 වර්ෂයේ දී ලෝක ආහාර වැඩසටහනට සහල් පරිත්‍යාග කිරීම සිදු කෙරිණි. 2014 අයවැය යෝජනාවක් අනුව ශ්‍රී ලංකා රජය විසින් මෙය සිදු කරන ලදී. ඒ අනුව, ලෝක ආහාර සංවිධානය අතීතයේ දී ශ්‍රී ලංකාව අසීරු තත්ත්වයන්ට මුහුණ පෑ අවස්ථාවන්වල දී දක්වන ලද සහයෝගය ඇගයීමක් ලෙස ලෝක ආහාර සංවිධානය වෙත සහල් මෙ.ටො. 50,000 ක් ප්‍රදානය කිරීමට ශ්‍රී ලංකාව එකඟ විය. තවද, ශ්‍රී ලංකාව තවදුරටත් ලෝක ආහාර සංවිධානයේ සහනලාභියෙකු වීම වෙනුවට වාණිජ සැපයුම්කරුවකුගේ තත්ත්වයට උසස් කිරීම ද අරමුණු කරන ලදී.

ලෝක ආහාර සංවිධානයට සහල් ප්‍රදානය කිරීමේ වැඩසටහන කොටස් දෙකකින් යුක්ත විය. එනම්, දේශීය වැඩසටහන සහ අන්තර්ජාතික වැඩසටහන වශයෙනි. සමස්ත ප්‍රදානය වූ සහල් මෙ.ටො. 50,000 කින් මෙ.ටො. 10,000 ක් දේශීය වැඩසටහන අරමුණු කර තිබූ අතර එය "ශ්‍රී ලංකා මානුෂීය සහයෝගීතාව" ලෙස නම් කෙරුණි. ඉතිරි සහල් මෙ.ටො. 40,000 ක ප්‍රමාණය ලෝක ආහාර සංවිධානයේ ආධාර බලාපොරොත්තු වන ශ්‍රී ලංකාවෙන් පිටත වූ ලෝක ආහාර සංවිධානයේ සාමාජික රටවල් සඳහා ප්‍රදානය කිරීමට නියමිතව ඇත.

ඒ අනුව, 2016 අවසන් වන විට රජය විසින් ලෝක ආහාර සංවිධානයේ දේශීය වැඩසටහන සඳහා සහල් මෙ.ටො. 6,341 ක් ප්‍රදානය කරන තිබුණි.

### 2.6.3 ජීවන වියදම් කළමනාකරණය කිරීම.

2016 වර්ෂය මැද භාගය වන විට ඇති වූ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ඉහළ යාමේ නැඹුරුතාවයට පිළියමක් ලෙස රජය විසින් මහජනතාවගේ ජීවන වියදම අඩු කිරීමේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස පාරිභෝගිකයාට දැරිය හැකි මිලක් තහවුරු කරමින් පහත සඳහන් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය දහසයක් සඳහා 2016.07.14 වන දින සිට බලපැවැත්වෙන පරිදි උපරිම සිල්ලර මිලක් නියම කරන ලදී.

**රූප සටහන 2.16 : අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය 16 ක් සඳහා නියම කරන ලද උපරිම සිල්ලර මිල**

| # | ආහාර ද්‍රව්‍ය | උපරිම සිල්ලර මිල (රු.) |
|---|---|---|
| 1 | මයිසූර් පරිප්පු | කි. ග්‍රෑම් එකක් රු. 169/- |
| 2 | වියළි හාල් මැස්සන් (ආනයනික - තායිලන්ත) | කි. ග්‍රෑම් එකක් රු. 495/- |
| | වියළි හාල් මැස්සන් (ආනයනික - ඩුබායි) | කි. ග්‍රෑම් එකක් රු. 410/- |
| 3 | කඩල | කි. ග්‍රෑම් එකක් රු. 260/- |
| 4 | මුං ඇට | කි. ග්‍රෑම් එකක් රු. 220/- |
| 5 | ටින් මාළු (ආනයනික) | ග්‍රෑම් 425 ක ශුද්ධ බර රු. 140/-<br>ග්‍රෑම් 280 ක දියර රහිත බර |
| | | ග්‍රෑම් 155 ක ශුද්ධ බර රු. 70/-<br>ග්‍රෑම් 105 ක දියර රහිත බර |
| 6 | සුදු සීනි | කි. ග්‍රෑම් එකක් රු. 95/- |
| 7 | තිරිඟු පිටි | කි. ග්‍රෑම් එකක් රු. 87/- |

| | | |
|---|---|---|
| 8 | සම්පුර්ණ යොදය සහිත කිරිපිටි - ආනයනික | |
| | ග්‍රෑම් 400 | රු. 325/- |
| | කි. ග්‍රෑම් 1 | රු. 810/- |
| 9 | සම්පුර්ණ යොදය සහිත කිරිපිටි - දේශීය | |
| | ග්‍රෑම් 400 | රු. 295/- |
| | කි. ග්‍රෑම් 1 | රු. 735/- |
| 10 | අධි ශීත කළ හෝ ශීත කළ කුකුල් මස් (සම්පූර්ණ කුකුළා) | |
| | සම සහිත | කි. ග්‍රෑම් එකක් රු. 410/- |
| | සම රහිත | කි. ග්‍රෑම් එකක් රු. 810/- |
| 11 | අර්තාපල් - ආනයනික | කි. ග්‍රෑම් එකක් රු. 120/- |
| 12 | බී ලූණු - ආනයනික | කි. ග්‍රෑම් එකක් රු. 78/- |
| 13 | වියළි මිරිස් (කුඩු නොකළ හෝ නොඇඹරූ) | කි. ග්‍රෑම් එකක් රු. 385/- |
| 14 | කරවල - කට්ටා | කි. ග්‍රෑම් එකක් රු. 1,100/- |
| | කරවල - සාලයා | කි. ග්‍රෑම් එකක් රු. 425/- |
| 15 | සස්ටජන් ග්‍රෑම් 400 | රු. 1,500/- |
| 16 | උම්බලකඩ | කි. ග්‍රෑම් එකක් රු. 1,500/- |

මූලාශ්‍රය : පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

ජීවන වියදම අඩු කිරීමට සහාය දැක්වීමක් ලෙස අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සඳහා පාරිභෝගිකයාට ලබා දුන් සහන තවදුරටත් පුළුල් කරමින් 2017 අයවැය මගින් මිල ගණන් තවදුරටත් අඩු කරන ලදී. ඒ අනුව, මුං ඇට මිල කි. ග්‍රෑම් එකක් සඳහා රු. 15/- කින් ද, පරිප්පු මිල කි. ග්‍රෑම් එකක් සඳහා රු. 10/- කින් ද, අර්තාපල් මිල කි. ග්‍රෑම් එකක් සඳහා රු. 5/- කින් ද, හාල්මැස්සන් මිල කි. ග්‍රෑම් එකක් සඳහා රු. 5/- කින් ද, සීනි මිල කි. ග්‍රෑම් එකක් රු. 5/- කින් ද. භූමිතෙල් මිල ලීටරයක් සඳහා රු. 5/- කින් ද ලෙස පැවති සහනදායී මිල ගණන් තවදුරටත් පහත හෙලන ලදී.

### 2.6.4 ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා සහල් ආනයනය කිරීම.

2016 යල කන්නය තුළ රටේ පැවති නියං තත්ත්වය සමඟ සහල් හිඟයක් අපේක්ෂා කරන ලදී. ඒ අනුව, වෙළඳපොලෙහි සහල් මිල ඉහළ යාමක් ඇති කිරීම සඳහා වූ මිල හැසරවීමක් සිදු වන බව නිරීක්ෂණය විය. මෙම තත්ත්වය මත ඇති විය හැකි වූ සහල් හිඟයට මුහුණ දීමට සහ රට පුරා විවෘත වෙළඳපොලෙහි සහල්වල සිල්ලර මිල ස්ථාවර කිරීම සඳහා රජය මැදිහත් වීමෙන් සහල් ආනයනය දිරිමත් කරන ලදී.

සහල් ආනයනයට පහසුකම් සැලසීම සඳහා 2017.01.07 දින සිට ක්‍රියාත්මක වන පරිදි සහල් මත මෙතෙක් පනවා තිබූ සියළුම බදු ඉවත් කරමින් ඒ වෙනුවට කි. ග්‍රෑම් එකක් සඳහා රු. 15/- ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පමණක් පනවන ලදී. සමස්ත සහල් ආනයන ප්‍රමාණය මෙ.ටො. 250,000 කට සීමා කරමින් පෞද්ගලික අංශයේ සියළුම ආනයනකරුවන්ට සහල් ආනයනය සඳහා අවසර දෙන ලදී. සහල් ආනයනය මත පැනවූ කි. ග්‍රෑම් එකක් සඳහා රු. 15/- ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2017.02.28 දින සිට ක්‍රියාත්මක වන පරිදි කි. ග්‍රෑම් එකක් සඳහා රු. 5/- ක් දක්වා පහත හෙලන ලදී. පසුව මෙම සහනය 2017 මැයි මස අවසානය දක්වා තවදුරටත් දීර්ඝ කරන ලදී. 2017 පෙබරවාරි 08 දින සිට ක්‍රියාත්මක වන පරිදි සම්බා සහල් කිලෝවක් සඳහා රු. 80/- ක්, නාඩු සහල් කිලෝවක් සඳහා රු. 72/- ක් සහ කැකුලු සහල් කිලෝවක් සඳහා රු. 70/- ක් ලෙස උපරිම සිල්ලර මිලක් නියම කරන ලදී. 2017.02.17 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි දේශීය සහල් සඳහා සම්බා සහල් කිලෝවක් රු. 90/- ක්, නාඩු සහල් කිලෝවක් රු. 80/-, ක් සහ කැකුලු සහල් කිලෝවකට රු. 78/- ක් ලෙස වෙනමම උපරිම සිල්ලර මිලක් නියම කරමින් සහල් වල උපරිම සිල්ලර මිල සංශෝධනය කළ අතර ආනයනික සහල් මත පනවා තිබූ උපරිම සිල්ලර මිල නොවෙනස්ව පැවතුණි. ඒ අනුව, 2017.03.30 වන විට ආනයනය කරන ලද මුළු සහල් ප්‍රමාණය මෙ.ටො. 254,196 කි.

තවද, සමුපකාර තොග වෙළඳ සංස්ථාව (සතොස) හරහා සහල් කර ලංකා සතොස අලෙවි සැල් මගින් රට පුරා බෙදා හැරීමට වී අලෙවි මණ්ඩලය මෙ.ටො. 10,000 ක් බැගින් වූ තොග ලෙස වී

මෙ.ටො. 20,000 ක් සතොස වෙත නිකුත් කරන ලදී. ඒ අනුව, සහල් හිඟයකින් තොරව දැරිය හැකි මිලකට වෙළඳපොලේ සහල් සුලභ කිරීමට රජයට හැකි විය.

## 2.7 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම.

### 2.7.1 සාධාරණ මිලකට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ නිෂ්පාදන සඳහා සුපිරි වෙළඳ සැල්වල ප්‍රමුඛ රාක්කවල ඉඩ ලබා දීම.

2016 අයවැය මඟින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ නිෂ්පාදකයින් ප්‍රචාරණය සඳහා මූල්‍ය පහසුකම් නොමැතිකමින් දුෂ්කරතාවලට මුහුණ දෙන බවත් ඒ අනුව, සුපිරි වෙළඳ සැල්වල ප්‍රමුඛ රාක්කවල තම නිෂ්පාදන ප්‍රදර්ශනය කර ගත නොහැකි වන බවත් හඳුනා ගෙන ඇත. එම නිසා, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා රාක්කවල ප්‍රමුඛ ඉඩකඩ ලබා දීම 2016 අයවැය මඟින් යෝජනා කරන ලදී. ඒ අනුව, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට කාර්ගිල්ස් හා කීල්ස් වැනි සුපිරි වෙළඳ සැල්වල රාක්කවල ඉඩ ලබා ගැනීමේ අවස්ථා සලසන ලදී.

### 2.7.2 මල් වගා කර්මාන්තය සම්බන්ධ අයවැය යෝජනා

මල් වගා කර්මාන්තය සඳහා ලෝකයේ ඉල්ලුම ඉහළ යෑමේ නැඹුරුවක් දක්නට ලැබේ. කෙසේ වුවද, මේ වන විට ලෝක අවශ්‍යතාව සඳහා ශ්‍රී ලංකාවේ දායකත්වය සියයට දශම දෙකක් පමණි. තවද, මල් සඳහා ඇති දේශීය ඉල්ලුම ද වැඩි වන බව පෙනී යයි. ඒ නිසා මල් වගා කර්මාන්තය පුළුල් කිරීම සඳහා රට තුළ ඉහළ විභවයක් පවතින බැවින් ඉහළ ආදායම් ඉපයීමට හා රැකියා අවස්ථා ඇති කිරීම සඳහා අවස්ථාව පවතී. මෙම විභවයන් හඳුනා ගනිමින්, 2017 අයවැය මඟින් මල් තවාන් 2,000 ක් ස්ථාපිත කිරීම දිරිගන්වමින් රජය මඟින් සියයට 50 ක පොළී සහනාධාරයක් යටතේ ණය ලබා දීමට තීරණය කරන ලදී. ඒ අනුව, මෙය ශ්‍රී ලංකාවේ මල් වගා කර්මාන්තය ප්‍රචලිත කිරීම සඳහා වැඩි අවස්ථාවක් නිර්මාණය කිරීමේ මූලාරම්භයක් වනු ඇත.

### 2.7.3 ගබඩා ඉදි කිරීම තුළින් ගුදම් පහසුකම් සැලසීම.

ලෝක බැංකුවේ සහාය ඇතිව රජය විසින් ආරම්භ කිරීමට යෙදුනු නවීන පහසුකම්වලින් යුතු ගබඩා සංකීර්ණ මඟින් අස්වනු නෙලන කාලය තුළ දී ගොවීන් හට ගුදම් පහසුකම් මෙමඟින් සැලසීමට කටයුතු කෙරේ. ඒ අනුව, කෘෂිකාර්මික දිස්ත්‍රික්කයන් තුළ මෙම ඉදි කිරීම් කරනු ලබන අතර මෙමඟින් වී, බඩඉරිඟු, සෝයා බෝංචි, තල, උඳු, ගම්මිරිස් මෙන්ම රටකජු සඳහා ගබඩා කිරීමට පහසුකම් සැලසේ. මෙහි ප්‍රධාන අරමුණ වනුයේ එසේ ගබඩා කරන ලද භාණ්ඩ සුරැකුම් ලෙස තබා ගණුදෙනු කළ හැකි මූල්‍යකරණ ලදුපතක් ලබා ගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීමයි. ඒ අනුව, අනුරාධපුර, මොණරාගල සහ මන්නාරම යන දිස්ත්‍රික්ක තුනෙහි ගබඩා තුනක් ඉදි කර ඇති අතර එහි මුළු ධාරිතාව මෙ.ටො. 24,000 ක් පමණ වේ.

2016 වර්ෂය තුළ දී උපුල්දෙණිය ගබඩා සංකීර්ණයෙහි ගොවීන් 150 දෙනෙකු තම බෝග ගබඩා කරන ලද අතර එයින් 80 දෙනෙක් රු. මිලියන 6.6 ක මුදලක් මෙම ලදුපත සුරැකුම් ලෙස තබා කෙටිකාලීන ණය පහසුකම් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මඟින් ලබා ගෙන ඇත. මෙම කාල සීමාව තුළ දීම බුත්තල ගබඩා සංකීර්ණයේ ගොවීන් 34 දෙනෙකු තම බෝග ගබඩා කරන ලද අතර එයින් 14 දෙනෙකු රු. මිලියන 1.5 ක මුදලක් කෙටි කාලීන ණය පහසුකම් ලෙස ලබා ගෙන ඇත.

2016 දෙසැම්බර් 31 වන විට උපුල්දෙණිය ගබඩාවේ ධාන්‍ය වර්ග 5 ක් ගබඩා කර තිබූ අතර එයින් ප්‍රධාන වශයෙන් වී (මෙ.ටො. 230.6), සෝයා බෝංචි (මෙ.ටො. 94.9), බඩඉරිඟු (මෙ.ටො. 68.7), සහ තල (මෙ.ටො. 24.9) වේ. අස්වනු නෙලන කාලයේ දී අදාළ ප්‍රදේශයන්හි ගොවීන් මෙසේ සපයා ඇති ගබඩා පහසුකම් ප්‍රයෝජනයට ගන්නා අතර මිල ස්ථායි වූ අවස්ථාවේ දී ඔවුන් ඒවා විකිණීමට කටයුතු කරයි.

ගබඩා කරන ලද මුළු අස්වනු තොගයේ වටිනාකම රු. 20,447,750.20 ක් වන අතර එය විකුණන අවස්ථාවේ දී මුළු වටිනාකම රු. 24,923,803.75 ක් විය. මේ අනුව ගොවීන් හට රු. 4,476,053.55 ක ප්‍රතිලාභයක් ලබා ගැනීමට හැකි වී තිබේ. මෙම අස්වනු තොගය සඳහා ගුදම් ගාස්තු වශයෙන් රු. 457,174.54 ක් සහ පිරිසිදු කිරීමේ ගාස්තු වශයෙන් රු. 210,428.30 ක මුදලක් ලබා ගෙන ඇත.

මෙම ව්‍යාපෘතිය මගින් ලබා ගෙන ඇති ප්‍රගතිය නිසා රජය විසින් තවත් මෙවන් ගබඩා සංකීර්ණ 3 ක් ඉදි කිරීමට යෝජිතය. එනම්, පොළොන්නරුව, කිලිනොච්චිය, හා රත්නපුර දිස්ත්‍රික්කයන් වේ. මෙම යෝජිත ගබඩා සංකීර්ණ 3 හි ඉදි කිරීම් 2016 අයවැය යෝජනා අනුව සිදු වේ.

වගුව 2.17 : අලෙවිකරණ ආදායම් වාර්තාව - රජයේ ධාන්‍ය ගබඩාව - උපුල්දෙණිය - 2016.12.31 දිනට

| ධාන්‍ය වර්ගය | ප්‍රමාණය (මෙ.ටො.) | ගබඩා කළ පසු වටිනාකම (රු.) | අලෙවි කළ පසු වටිනාකම (රු.) | දළ වටිනාකම (රු.) | ගබඩා ගාස්තු (රු.) | පොලිසැක් මළු ගාස්තු (රු.) | පිරිසිදු කිරීමේ ගාස්තු (රු.) | ශුද්ධ වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|---|
| බඩඉරිඟු | 65 | 2,258,279 | 3,045,442 | 787,163 | 29,432 | 24,542 | | 733,189 |
| වී | 231 | 6,751,718 | 8,963,171 | 2,211,453 | 200,739 | 117,020 | | 1,893,695 |
| තල | 25 | 3,370,370 | 3,898,703 | 528,333 | 148,135 | 14,025 | | 366,173 |
| සෝයා බෝංචි | 95 | 8,067,384 | 9,016,488 | 949,104 | 78,869 | 95,220 | 210,428 | 949,104 |
| **එකතුව** | **415** | **20,447,750** | **24,923,804** | **4,476,054** | **457,175** | **250,807** | **210,428** | **3,942,161** |

මූලාශ්‍රය : රජයේ ධාන්‍ය ගබඩාව, උපුල්දෙණිය

## 2.8 සත්ත්ව නිෂ්පාදන අංශයේ සංවර්ධනය

### 2.8.1 කුකුල් ගොවිපල ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රය

ශ්‍රී ලංකාවේ කුකුල් ගොවිපල ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රය පාරිභෝගිකයින්ගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීමට වැදගත් දායකත්වයක් ලබා දේ. ශ්‍රී ලංකාව කුරුලු උණ රෝගය නොපැතිරුන රටක් වශයෙන් අනෙකුත් රටවල් හා සංසන්දනය කිරීමේ දී මෙම ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය සතුටුදායක මට්ටමක පවතී. තවද, පශු සම්පත් ක්ෂේත්‍රයේ නව තාක්ෂණික දියුණුව නිසා වෙළඳපොල තරඟකාරීත්වය හා ඵලදායීත්වය ද ඉහළ ගොස් ඇත.

පවත්නා දත්ත අනුව, කුකුල් මස් නිෂ්පාදනය 2010 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මෙ.ටො. 104,160 සිට මෙ.ටො. 173,830 දක්වා අනුපිළිවෙලින් වර්ධනය වී ඇත.

වගුව 2.18 : දේශීය කුකුල් මස් හා බිත්තර නිෂ්පාදනය

| | කුකුල් මස් නිෂ්පාදනය | | බිත්තර නිෂ්පාදනය | |
|---|---|---|---|---|
| වර්ෂය | ඇස්තමේන්තුව (මෙ.ටො. '000) | සත්‍ය (මෙ.ටො. '000) | ඇස්තමේන්තුව (මිලියන) | සත්‍ය (මිලියන) |
| 2010 | අදාළ නැත. | 104.16 | අදාළ නැත. | 1384.80 |
| 2011 | අදාළ නැත. | 116.76 | අදාළ නැත. | 1711.22 |
| 2012 | අදාළ නැත. | 137.39 | අදාළ නැත. | 2278.72 |
| 2013 | 142.99 | 144.54 | 2077.69 | 2074.94 |
| 2014 | 143.37 | 150.32 | 2086.31 | 2232.02 |
| 2015 | 160.57 | 164.45 | 2203.00 | 2294.08 |
| 2016 | 168.41 | 173.83 | 2187.00 | 2204.17 |

මූලාශ්‍රය : සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

පාරිභෝගිකයන්ගේ ක්‍රය ශක්තිය ඉහළ යෑම, කුකුල් ගොවිපල ආශ්‍රිත නිෂ්පාදන සුලභතාවය වර්ධනය වීම හා වෙළඳපොලේ පවත්නා මාළු ඇතුළු අනෙකුත් ප්‍රෝටීනමය ආහාර ආදේශන සමඟ සැසඳීමේ දී සාපේක්ෂව මිල ගණන් පහළ මට්ටමක පැවතීම හේතුවෙන් පාරිභෝගිකයන්ගේ කුකුල් මස් හා බිත්තර පාරිභෝජනය අඛණ්ඩව වර්ධනය වෙමින් පවතී.

කුකුල් ගොවිපල ආශ්‍රිත නිෂ්පාදනයන් ආරක්ෂා කිරීම සහ වෙළඳපොලෙහි සාධාරණ මිල ගණන් යටතේ කුකුල් මස් සැපයීම සඳහා කුකුල් ගොවිපල ආශ්‍රිත නිෂ්පාදන ක්ෂේත්‍රයට සහනදායී බදු අනුපාත යටතේ බඩඉරිඟු ආනයනය කිරීම සඳහා රජය මගින් බලපත්‍ර නිකුත් කිරීමෙන් සහන සලසා ඇත. කුකුල් ගොවිපල ආශ්‍රිත නිෂ්පාදකයින්ට වෙළඳපොල අවස්ථා තවදුරටත් වර්ධනය කර ගැනීමටත් එම ක්ෂේත්‍රයේ ඵලදායීතාවය ඉහළ නැංවා ගැනීමට අවස්ථාව සකසා දීම සඳහාත් විවෘත වෙළඳපොලේ තරඟකාරී මිල ගණන් යටතේ කුකුල් ගොවිපල ආශ්‍රිත නිෂ්පාදන අලෙවියට අවස්ථාව සකසා දීම සඳහා කුකුල් මස් සඳහා වූ පාලන මිල ඉවත් කරන ලදී.

2016 වර්ෂය තුළ දේශීය බඩඉරිඟු ගබඩාකරුවන් බඩඉරිඟු මෙ.ටො. 67,000 ක් පමණ ඉහළ මිලක් බලාපොරොත්තුවෙන් ගබඩා කර තබා ගන්නා ලද අතර, රජය ඔවුන්ට සාධාරණ මිලක් ලබා දීම තහවුරු කිරීම සඳහා මෙම තොගය සත්ත්ව ආහාර නිෂ්පාදනය සඳහා දැරිය හැකි මිලකට

සැපයීමට මැදිහත් වන ලදී. ඒ අනුව, මෙම බඩඉරිඟු තොගය කි. ග්‍රෑම් එකක් රු. 52.50 ක මිලකට මිල දී ගෙන කුකුල් ගොවිපල ආශ්‍රිත නිෂ්පාදන පිරිවැය අවම කිරීමේ අරමුණින් කි. ග්‍රෑම් එකක් රු. 45.00 ක මිලකට කුකුල් ගොවිපල ආශ්‍රිත නිෂ්පාදකයින්ට ලබා දෙන ලදී. රජය කි. ග්‍රෑම් එකක් සඳහා වූ රු. 7.50 ක වෙනස සහනාධාරයක් වශයෙන් ලබා දෙන ලදී. සත්ත්ව ආහාර වෙළඳපොලේ වාර්ෂික බඩඉරිඟු අවශ්‍යතාවය සලකා බලා කුකුල් ගොවිපල ආශ්‍රිත නිෂ්පාදන වෙළඳපොල තුළ හිඟය සපුරාලීම සඳහා 2016 වර්ෂයේ බඩඉරිඟු කි. ග්‍රෑම් එකක් රු. 10.00 ක විශේෂ භාණ්ඩ හා සේවා බද්දක් යටතේ බඩඉරිඟු මෙ.ටො. 72,200 ක් ආනයකයට බලපත්‍ර ලබා දෙන ලදී.

### 2.8.2 කිරි නිෂ්පාදන අංශය

ග්‍රාමීය ආර්ථිකයේ නැගී එන අංශයක් ලෙස කිරි නිෂ්පාදන අංශය හඳුනාගෙන ඇත. එය ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම, විරැකියාව හා දරිද්‍රතා මට්ටම අඩු කිරීම, අඩු ආදායම්ලාභී කුටුම්බයන්හි පෝෂණ තත්ත්වයන් ඉහළ නැංවීම තුළින් ග්‍රාමීය ආර්ථිකය ගොඩ නැගීම සඳහා ඉතා වැදගත් කර්යයභාරයක් ඉටු කරනු ලබයි. රට තුළ විශාල කිරි නිෂ්පාදන වෙළඳපොලක් පැවතුන ද දේශීය කිරි නිෂ්පාදයන්හි සමස්ත කිරි අවශ්‍යතාවය සපුරාලීම ප්‍රමාණවත් නොවීම නිසා මුළු කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදනවල අවශ්‍යතාවයෙන් සියයට 55 ක පමණ ප්‍රමාණයක් ආනයනය කරනු ලබයි. මෙම පසුබිම මත රජය විසින් රට තුළ දේශීය කිරි කර්මාන්තය වැඩි දියුණු කිරීම සඳහා විවිධ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හඳුන්වා දී ඇත. ජාතික කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම හා කිරි ආනයනය මත වැය වන විදේශ විනිමය ඉතිරි කර ගැනීමේ අරමුණින් සහ දේශීය වෙළඳපොල තුළ කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන දැරිය හැකි මිලකට ලබා ගැනීමට හැකි වන පරිදි වාණිජ මට්ටමේ කිරි කර්මාන්තය ප්‍රවර්ධනයට අදාළ ප්‍රතිපත්ති, අමු කිරි මිල තීරණය කිරීම, වෙළඳ හා තීරුබදු ප්‍රතිපත්ති, මෑත කාලවකවානුව තුළ හඳුන්වා දෙන ලදී.

2016 අයවැය යෝජනාවලට අනුව, දේශීය කිරිපිටි නිෂ්පාදන දිරිමත් කිරීම හා පාරිභෝගිකයින්ට සහන මිලකට කිරිපිටි ලබා දීමේ අරමුණින් දේශීය කිරිපිටි මිල අඩු කරන ලදී. මෙම මිල පහත හෙළීමට සමගාමීව, දේශීය කිරිපිටි නිෂ්පාදන සමාගම් සඳහා ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ නිර්දේශය සහිතව මිල සහනාධාරයක් ලබා දෙන ලදී. ඒ අනුව, දේශීය කිරි නිෂ්පාදන සමාගම් වන මිල්කෝ (පුද්.) සමාගම හා පැලවත්ත කිරි නිෂ්පාදන සමාගම විසින් නිෂ්පාදනය කරන ලද ග්‍රෑම් 400 හා කිලෝ ග්‍රෑම් 1 හි කිරිපිටි පැකට් එකක මිල පහත හෙළන ලද අතර 2016 වර්ෂය තුළ එම සමාගම් සඳහා ප්‍රතිපූර්ණය කරන ලද මුදල පහත දැක්වේ.


**වගුව 2.19 : 2016 වර්ෂය තුළ දේශීය කිරිපිටි නිෂ්පාදකයින් වෙත ප්‍රතිපූර්ණය කරන ලද මුදල**

| සමාගම | ඒකකය | වෙළඳපොල මිල (රු.) | අයවැය මත පදනම්වූ විකුණුම් මිල (රු.) | සහනාධාර මිල (රු.) |
|---|---|---|---|---|
| මිල්කෝ (පුද්.) සමාගම | ග්‍රෑම් 400 | 320 | 295 | 234,191,350 |
| | කි. ග්‍රෑම් 1 | 790 | 735 | 7,172,000 |
| පැලවත්ත කිරි නිෂ්පාදන සමාගම | ග්‍රෑම් 400 | 325 | 295 | 200,714,670 |
| | කි. ග්‍රෑම් 1 | 810 | 735 | 41,079,675 |

මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

ඉහත දැක්වෙන පරිදි, 2016 වර්ෂය තුළ රජය විසින් රු. මිලියන 483 ක් දේශීය කිරි නිෂ්පාදකයින් සඳහා මිල සහනාධාර ගෙවීමට වැය කර ඇත. එයට අමතරව, 2017 වර්ෂය සඳහා රු. මිලියන 650 ක් මෙම අරමුණ සඳහා වෙන් කර ඇත.

දේශීය කිරිපිටි වලට සාපේක්ෂව ආනයනික කිරිපිටි ද දේශීය කිරි අවශ්‍යතාවයෙන් සියයට 55 ක් සපුරාලන හෙයින් දේශීය කිරි කර්මාන්තය කෙරෙහි සැලකිය යුතු මට්ටමක බලපෑමක් ඇති කරයි. වාර්ෂික කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන මෙ.ටො. 80,000 ක් පමණ දේශීය ඉල්ලුම සපුරාලීම සඳහා රටට ආනයනය කළ යුතු වේ. දේශීය කිරි පාරිභෝගිකයින් ආරක්ෂා කර ගැනීම සඳහා රජය විසින් කිරිපිටි වලට උපරිම සිල්ලර මිලක් පනවා ඇති බැවින් ගෝලීය මිල උච්චාවචනයන්ට සාපේක්ෂව දේශීය කිරිපිටි වල මිල වෙනස් කිරීමට ඉඩ ප්‍රස්ථා ලබා දී නොමැත. ඒ අනුව, කිරිපිටි ආනයනකරුවන්ගේ ඉල්ලීම මත 2016 වර්ෂය තුළ කිරිපිටි වලට අදාළ ආනයනික බදු අනුපාතයන් අවස්ථා කිහිපයක දී සංශෝධනය කළ අතර රූප සටහන 2.10 හි දක්වා ඇති පරිදි ආසන්නතම මිල සංශෝධනය 2016 දෙසැම්බර් මාසයේ දී සිදු කරන ලදී.



රූප සටහන 2.10 : කිරිපිටි වලට අදාළ ගෝලීය මිල
(2014 ජූනි සිට 2017 ජනවාරි දක්වා)

සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දත්ත වලට අනුව රට තුළ ඉහළ කිරි අස්වැන්නක් සහිත සතුන්ගේ ඌනතාවයක් පවතින අතර වාණිජ ඒකකයක් වශයෙන් තිරසාර කිරි නිෂ්පාදන මට්ටම වන දිනකට ලීටර් 20 කට වඩා වැඩියෙන් නිෂ්පාදනය කරනු ලබන්නේ රට තුළ ඇති 20,000 ක් පමණ වන ගොවිපල සංඛ්‍යාවෙන් සියයට 4 ක් පමණක් වේ. දැනටමත් 4,500 ක් පමණ කිරි එළදෙනුන් මෙරටට ආනයනය කර ඇතත් මෙම අවශ්‍යතාවය සපුරාලීමට එය ප්‍රමාණවත් නොවේ. ඒ අනුව, දේශීය කිරි නිෂ්පාදනය නඟා සිටුවීම හා රට තුළ ඉහළ කිරි අස්වැන්නක් සහිත සතුන් වැඩි කිරීමේ අරමුණින් රජය විසින් දැනටමත් පියවර ගෙන ඇති අතර, එහි පළමු අදියරේ දී ඉහළ කිරි අස්වැන්නක් සහිත කිරි එළදෙනුන් 5,000 ක් ඕස්ට්‍රේලියාවෙන් ආනයනය කිරීමට සහ දෙවන අදියරේ දී කිරි එළදෙනුන් 15,000 ක් ආනයනය කිරීමටත් බලාපොරොත්තු වේ. මෙම ආනයනික සතුන් සඳහා නව ගොවිපලවල ආරම්භක පිරිවැය අධික වීමත් සැලකිය යුතු ලාභයක් නොලැබීමත් සලකා බලා මෙම ව්‍යාපෘති සඳහා ආයෝජනය කරනු ලබන පෞද්ගලික ආයෝජකයින්ට හෝ ගොවීන්ට මූල්‍ය සහන වැඩසටහනක් යටතේ සහාය ලබා දීමට ද රජය බලාපොරොත්තු වේ.

### 2.8.3 කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය

මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය (CSDDLS) අවම වශයෙන් කිරි එළදෙනුන් 25 ක් සහිත මෙගා ගොවිපලවල් 1,000 ක් ස්ථාපිත කිරීම සඳහා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් වාණිජ මට්ටමේ කිරි නිෂ්පාදනය සඳහා දිරිමත් කිරීමේ අරමුණින් 2013 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. මේ යටතේ මධ්‍ය පරිමාණයේ සිට මහා පරිමාණය දක්වා කිරි නිෂ්පාදන කටයුතු සඳහා සියයට 6 ක වාර්ෂික පොළී අනුපාතයක් යටතේ ණය පහසුකම් ලබා දෙන අතර රජය මඟින් සියයට 6 ක පොළී සහනාධාරයක් තෝරාගත් සහභාගීත්ව මූල්‍ය ආයතන 13 ක් සඳහා ගෙවනු ලබයි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ උපරිමය රු. මිලියන 25 ක් දක්වා ණය ප්‍රදානය කරනු ලබන අතර මාස 6 ක සහන කාලයක් ඇතුළත්ව ණය ආපසු ගෙවීමේ සහන කාලය වසර 5 කි. මෙම ක්ෂේත්‍රයේ නියැලෙන ව්‍යවසායකයින්ගේ විශේෂ ඉල්ලීම මත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට සහයෝගය දැක්වීමේ අරමුණින් ගොවිපලක අවම කිරි එළදෙනුන් සංඛ්‍යාව 07 ක් දක්වා 2014 වර්ෂයේ දී අඩු කරන ලදී. 2016.12.31 දිනට මෙම ණය යෝජනා ක්‍රමයේ ප්‍රගතිය පහත පරිදි වේ.


වගුව 2.20 : මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ ප්‍රගතිය

| වර්ෂය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ණය ප්‍රමාණය (රු. මිලියන) | ගෙවනු ලැබූ සහනාධාරය (රු. මිලියන) |
|---|---|---|---|
| 2013 | 60 | 202.20 | 1.8 |
| 2014 | 604 | 950.90 | 41.9 |
| 2015 | 1,424 | 1,227.77 | 80.1 |
| 2016 | 2,667 | 1,633.49 | 139.4 |
| **එකතුව** | **4,755** | **4,014.36** | **263.2** |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

මෙම ණය යෝජනා ක්‍රමයට අදාළ පොළී අනුපාතය සියයට 8 සිට සියයට 6 දක්වා 2014 වර්ෂයේ අග දී අඩු කිරීම හේතුවෙන් පසුගිය වසර 2 තුළ දී ණය සඳහා ඉල්ලුම ඉහළ අගයක් ගෙන ඇත. 2016 වසර අවසන් වන විට කිරි ගොවීන් 4,755 ක් මේ යටතේ ප්‍රතිලාභ ලබා ගෙන ඇති අතර ප්‍රදානිත ණය මුදල රු. බිලියන 4 ද ඉක්මවයි. රජය විසින් පොළී සහනාධාර ලෙස රු. මිලියන 263 ක් සහභාගීත්ව මූල්‍ය ආයතන සඳහා 2016 දෙසැම්බර් අග වන විට ලබා දී ඇත.

**රූප සටහන 2.11 : මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ 2015 හා 2016 වර්ෂවල ලබා දුන් ණය සංඛ්‍යාව**




2015 හා 2016 වර්ෂ තුළ දී නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව විසින් ඉහළම ණය ප්‍රදානය වන රු. මිලියන 601 ක් ප්‍රදානය කර ඇති අතර, පිළිවෙලින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා හැටන් නැෂනල් බැංකුව විසින් රු. මිලියන 444 ක් හා රු. මිලියන 432 ක් ණය වශයෙන් ප්‍රදානය කර ඇත. රජයේ බැංකු වලට සාපේක්ෂව හැටන් නැෂනල් බැංකුව, සම්පත් බැංකුව හා කොමර්ෂල් බැංකුව සැලකිය යුතු ණය ප්‍රදානයන් මෙම කාල පරිච්ඡේදය තුළ කිරි නිෂ්පාදන අංශය වෙනුවෙන් ලබා දී ඇත.

## 2.9 අත්‍යවශ්‍ය බෝග සංවර්ධනය සඳහා සහාය ලබා දීම.

2017 - 2020 රාජ්‍ය ආයෝජන වැඩසටහනට අනුව, අතිරේක ආහාර බෝග උත්පාදනය මගින් ඒවායේ නිෂ්පාදනය හා ඵලදායීතාවය ඉහළ නංවන අතරම ආහාර ද්‍රව්‍ය ආනයනය අවම කිරීම මගින් ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා රජය විසින් බොහෝ ක්‍රියාමාර්ග යෝජනා කර ඇත. ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන, මහා පරිමාණ කෘෂිකාර්මික කලාප ස්ථාපිත කිරීම හා සංවර්ධනය හා අගයදාම සංවර්ධනය ශක්තිමත් කිරීම මෙසේ මධ්‍යකාලීනව දියත් කිරීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග වේ.

වර්තමානයේ, දේශීය වෙළඳපොල සැපයුම ප්‍රමාණවත් නොවන නිසා බොහෝ අත්‍යවශ්‍ය ක්ෂේත්‍ර බෝග දේශීය ඉල්ලුම සපුරාලීම සඳහා ආනයනය කිරීමට සිදුව ඇත. මෙම ක්ෂේත්‍ර බෝගයන්ගෙන්ද, බඩඉරිඟු, සෝයා බෝංචි, අර්තාපල්, ලොකු ලූනු හා මිරිස් සඳහා ප්‍රමුඛස්ථානයක් ලැබෙනුයේ එම බෝග ආනයනය මගින් වාර්ෂිකව සැළකිය යුතු මට්ටමේ විදේශ විනිමය ප්‍රමාණයක් වැය වීම හේතුවෙනි. එම නිසා, රජය විසින් මෙම බෝගයන්හි ඵලදායීතාවය නංවාලීම සඳහා පොහොර සහනාධාර මුදල් ලබා දීම වැනි බොහෝ සහන තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. එසේම, රජය පහසුකම් සපයන්නෙකු හා නියාමකයෙකු වශයෙන් මෙකී අත්‍යවශ්‍ය බෝග සඳහා අවශ්‍ය විට සහතික මිලක් තහවුරු කිරීම හා බදු ප්‍රතිපත්තිය අනුගාමී ලෙස ගැලපීම මගින් දේශීය ගොවීන් ආරක්ෂා කිරීමට කටයුතු කර ඇත.

### 2.9.1 අර්තාපල්

සාමාන්‍ය වාර්ෂික අර්තාපල් අවශ්‍යතාවය මෙ.ටො. 160,000 ක් පමණ වන අතර, මුළු අවශ්‍යතාවයෙන් සියයට 50 ක් පමණ දේශීයව නිපදවයි. අර්තාපල්, බදුල්ල හා නුවර එළිය යන දිස්ත්‍රික්කන්හි මූලිකව වගා කෙරේ. රජය විසින් අර්තාපල් සඳහා වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2016.07.22 වන දින සිට කිලෝවකට රු. 35/- ක් දක්වා ඉහළ නංවන ලද අතර එමගින් දේශීය අර්තාපල් නිෂ්පාදිතය වෙළඳපොල කරා එන විට දේශීය ගොවීන් රැක ගැනීම අරමුණු කර තිබේ. 2018 වර්ෂයේ දී අර්තාපල් ආනයනය සියයට 35 දක්වා අඩු කිරීම සඳහා වගා බිම් ප්‍රමාණය

හෙක්ටයාර 6,500 දක්වා ඉහළ නැංවීම හා ඵලදායීතාව හෙක්ටයාරයට මෙ.ටො. 20 දක්වා ඉහළ නැංවීම ඉල්ලක කර ඇත.

### 2.9.2 ලොකු ලූනු

සාමාන්‍ය වාර්ෂික ලොකු ලූනු අවශ්‍යතාවය මෙ.ටො. 235,000 ක් පමණ වන අතර, සාමාන්‍ය වාර්ෂික නිෂ්පාදනය මෙ.ටො. 100,000 ක් පමණ වේ. ලොකු ලූනු, මාතලේ, අනුරාධපුරය, හම්බන්තොට හා මොණරාගල දිස්ත්‍රික්කයන්හි මූලිකව වගා කෙරේ. රජය විසින් ලොකු ලූනු සඳහා වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2016.07.22 වන දින සිට කිලෝවකට රු. 25/- ක් දක්වා ඉහළ නංවන ලද අතර එමගින් දේශීය ලොකු ලූනු නිෂ්පාදිතය වෙළඳපොල කරා එන විට දේශීය ගොවීන් රැක ගැනීම අරමුණු කර තිබේ. 2018 වර්ෂයේ දී ලොකු ලූනු නිෂ්පාදනය මෙ.ටො. 148,000 ක් දක්වා ඉහළ නැංවීම සඳහා වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර 7,400 ක් දක්වා ඉහළ නැංවීම හා ඵලදායීතාවය හෙක්ටයාරයට මෙ.ටො. 20 දක්වා ඉහළ නැංවීමට අරමුණු කර තිබේ.

### 2.9.3 මිරිස්

සාමාන්‍ය වාර්ෂික අමු මිරිස් අවශ්‍යතාවය මෙ.ටො. 30,000 ක් පමණ වන අතර එය දේශීය නිෂ්පාදනයෙන් සපුරා ගනු ලැබේ. කෙසේ වෙතත්, වාර්ෂික අවශ්‍යතාවය මෙ.ටො. 50,000 ක් පමණ වන වියළි මිරිස්වලින් සියයට 20 ක් පමණක් දේශීයව නිෂ්පාදනය කරනු ලැබේ. මිරිස්, අනුරාධපුරය, පුත්තලම හා මොණරාගල යන දිස්ත්‍රික්කයන්හි මූලිකව වගා කෙරේ. 2016 වර්ෂයේ දී, අඹරා කුඩු කරන ලද වියළි මිරිස් කිලෝවක් සඳහා විශේෂ වෙළෙ භාණ්ඩ බද්ද රු. 125/- ක් ලෙසද එසේ අඹරා කුඩු නොකරන ලද වියළි මිරිස් කිලෝවක් සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රු. 25/- ක් ලෙස ද පවත්වාගෙන යනු ලැබිණි. 2018 වර්ෂයේ දී, මිරිස් ආනයනය සියයට 50 ක් දක්වා අඩු කිරීම සඳහා වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර 30,000 ක් දක්වා ඉහළ නැංවීමට ඉලක්ක කර ඇත.


### 2.9.4 සෝයා බෝංචි

මුළු වාර්ෂික සෝයා බෝංචි අවශ්‍යතාවය මෙ.ටො. 220,000 ක් වන අතර සාමාන්‍ය වාර්ෂික නිෂ්පාදනය මෙ.ටො. 22,250 ක් පමණ වේ. එම නිසා, වාර්ෂික සෝයා බෝංචි අවශ්‍යතාවයෙන් සියයට 90 ක් පමණ ආනයනය කෙරේ. සෝයා බෝංචි, "ත්‍රිපෝෂ" නිෂ්පාදනය සඳහා ප්‍රධාන අමුද්‍රව්‍යයක් වශයෙන් යොදා ගනු ලබන අතර සාමාන්‍යයෙන් මහවැලි 'එච්' කලාපය, අනුරාධපුරය හා අම්පාර දිස්ත්‍රික්කයන්හි වගා කෙරේ. 2018 වර්ෂයේ දී, සෝයා බෝංචි ආනයනය සියයට 70 දක්වා අඩු කිරීම සඳහා වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර 42,175 දක්වා ඉහළ නැංවීම හා ඵලදායීතාවය හෙක්ටයාරයට මෙ.ටො. 2 ක් දක්වා ඉහළ නැංවීම ඉලක්ක කර ඇත.

### 2.9.5 බඩඉරිඟු

සත්ත්ව ආහාර නිෂ්පාදනයේ දී ප්‍රධාන අමුද්‍රව්‍යයක් වශයෙන් බඩඉරිඟු භාවිතා කරනු ලබන අතර මේ වන විට වාර්ෂික බඩඉරිඟු අවශ්‍යතාවය මෙ.ටො. 400,000 ක් පමණ වේ. බඩඉරිඟු, අනුරාධපුරය, මොණරාගල, බදුල්ල හා අම්පාර යන දිස්ත්‍රික්කයන්හි මූලිකව වගා කරනු ලබන අතර දේශීය බඩඉරිඟු නිෂ්පාදනය දළ වශයෙන් මෙ.ටො. 250,000 ක් පමණ වේ. 2018 වර්ෂයේ දී බඩඉරිඟු නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත වීමට අපේක්ෂා කරනු ලබන අතර, ඒ සඳහා වගා ඉලක්කය හෙක්ටයාර 110,000 දක්වා ඉහළ නැංවීමට හා ඵලදායීතාවය හෙක්ටයාරයට මෙ.ටො. 5 දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.

**සිතියම 2.1 : 2016 වර්ෂයේ බඩඉරිඟු, සෝයා බෝංචි, අර්තාපල්, ලොකු ලූනු හා මිරිස් යන බෝගයන්හි නිෂ්පාදනය (මෙ.ටො.)**




මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 2.10 ඉලක්කගත කණ්ඩායම් සඳහා වූ විශේෂ දිරි දීමනා

### 2.10.1 ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ලබා දෙන විශේෂ පොළී අනුපාතිකය

තම තරුණ අවධිය රටෙහි සංවර්ධනය වෙනුවෙන් වැය කළ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා මූල්‍යමය අතින් ශක්තිමත් හා සුරක්ෂිත විශ්‍රාම දිවියක් ලඟා කර දීමේ අරමුණ ඇතිව වයස අවුරුදු 60 වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු සඳහා විශේෂ පොළී අනුපාතයක් ලබා දීමට කටයුතු කරන ලදී. ඒ අනුව, බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක

තම සමස්ත ස්ථාවර තැන්පතු වටිනාකම රු. මිලියන 1 හෝ ඊට අඩු වන ලෙස තනි පුද්ගල පදනම මත තැන්පත් කරනු ලබන ජ්‍යෙෂ්ඨ පුරවැසියන් මෙම සියයට 15 ක් වන විශේෂ වාර්ෂික පොළී අනුපාතය ලැබීමට සුදුසුකම් ලබයි. එමෙන්ම, මෙම යෝජනාව ක්‍රියාවට නැංවීමේ දී අදාළ බැංකුවලට තම සාමාන්‍ය පොළී අනුපාතයට අමතරව දැරීමට සිදුවන අතිරේක පිරිවැය කාර්තු පදනම මත මහා භාණ්ඩාගාරය විසින් එම බැංකු වෙත ප්‍රතිපූර්ණය කරනු ලබයි.

මෙම වැඩසටහන 2016 වර්ෂයේ දී ද සාර්ථකව ක්‍රියාත්මක කරන ලද අතර, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ලබා දුන් අමතර පොළිය වෙනුවෙන් වූ ප්‍රතිපූර්ණ කළ යුතු රු. මිලියන 14,618 ක පමණ මුදල් ප්‍රමාණයක් සඳහා ඉල්ලීම් අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් රජය වෙත ඉදිරිපත් කර ඇත.

**වගුව 2.21 : ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වූ විශේෂ පොළී අනුපාතිකයක් ලබා දීමේ වැඩසටහනේ කාර්තු වශයෙන් ප්‍රගතිය - 2016**

| විස්තරය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිපූර්ණය කළ මුදල (රු.) |
|---|---|---|
| 1 කාර්තුව | 401,765 | 4,590,898,130.52 |
| 2 කාර්තුව | 421,728 | 4,445,488,474.77 |
| 3 කාර්තුව | 423,461 | 3,061,407,261.56 |
| 4 කාර්තුව | 431,609 | 2,520,150,309.17 |
| **එකතුව** | | **14,617,944,176.02** |

මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

තවද, බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක තම සමස්ත ස්ථාවර තැන්පතු වටිනාකම රු. මිලියන 1.5 ක් හෝ ඊට අඩු වන ලෙස තනි පුද්ගල පදනම මත තැන්පත් කරනු ලබන ශ්‍රී ලාංකික ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙත මෙම සියයට 15 ක් වන විශේෂ වාර්ෂික පොළී අනුපාතය ලබා දෙන අයුරින් මෙම යෝජනා ක්‍රමය 2017 වර්ෂය තුළ දී ද ක්‍රියාත්මක කිරීමට 2017 අයවැය මඟින් යෝජනා කර ඇත.

### 2.10.2 සමාජගත කරන ලද අභ්‍යාසලාභීන් සඳහා වන ස්වයංරැකියා යෝජනා ක්‍රමය

සමාජගත කරන ලද අභ්‍යාසලාභීන් සඳහා ක්‍රියාත්මක වූ ස්වයංරැකියා ණය යෝජනා ක්‍රමයේ I අදියර ලංකා බැංකුව, මහජන බැංකුව හා ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව හරහා ඉලක්කගත ප්‍රතිලාභීන් 1,799 දෙනෙකු සඳහා රු. මිලියන 302 ක ණය මුදලක් ප්‍රදානය කරමින් 2014 වර්ෂයේ දී සාර්ථකව අවසන් කරන ලදී. රජය විසින් තෝරා ගත් සහභාගීත්ව මූල්‍ය ආයතන සඳහා පොළී සහනාධාර ගෙවීම නොකඩවා සිදු කළ අතර 2016 වර්ෂයේ අග වන විට පොළී සහනාධාරය වශයෙන් රු. මිලියන 46 ක් වැය කර ඇත .

මෙම ණය යෝජනා ක්‍රමයේ II අදියර ක්‍රියාත්මක කිරීම සඳහා 2016 වර්ෂයේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වූ අතර පුනරුත්ථාපනය කර සමාජගත කරන ලද අභ්‍යාසලාභීන්ගේ ආදායම් උත්පාදන මාර්ග ඇති කිරීම සඳහා අරමුදල් සැපයීමේ අරමුණින් මුදල් අමාත්‍යාංශය, පුනරුත්ථාපන අධිකාරිය හා ලංකා බැංකුව, මහජන බැංකුව හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව යන තෝරා ගත් සහභාගීත්ව මූල්‍ය ආයතන සමඟ ත්‍රෛපාර්ශ්වික ගිවිසුම් අත්සන් කරන ලදී. මෙම අදියර II යටතේ බැංකු පද්ධතිය හරහා රු. මිලියන 525 ක් ඉලක්කගත ප්‍රතිලාභීන් සඳහා ලබා දීමට අපේක්ෂිතය.

සමාජගත කරන ලද තරුණ අභ්‍යාසලාභීන්ට තම ජීවන වෘත්තිය සාර්ථක කර ගැනීම සඳහා මෙම ණය යෝජනා ක්‍රමය මහඟු අවස්ථාවක් උදාකර දී ඇත. මෙම තරුණයන්ට ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් හා ඔවුන්ගේ සමාජ ආර්ථික කටයුතු සංවර්ධනය සඳහා වන පසු අධීක්ෂණ වැඩසටහන් සඳහා සහභාගී වීමට හැකි වේ. තවද, මෙම ණය යෝජනා ක්‍රමය හරහා ඔවුන්ගේ ජීවන වෘත්තිය සාර්ථකව කර ගැනීමට අවශ්‍ය ආර්ථික පසුබිම ගොඩ නැගෙන අතර යහපත් පුරවැසියෙකු ලෙස සමාජයට මුහුණ දීමට හැකි වන ලෙස ශක්තිමත් පදනමක් ගොඩ නැගෙයි. ඒ අනුව, සුදුසුකම් ලබන අභ්‍යාසලාභීන්ට කෘෂි හා සත්ත්ව පාලන කටයුතු සඳහා උපකරණ මිල දී ගැනීම, කෘෂි ව්‍යාප්ත සේවාවන්, සත්ත්ව පාලනය, යන්ත්‍රෝපකරණ මිල දී ගැනීම, ගෘහාශ්‍රිත කර්මාන්ත, ධීවර කටයුතු, සුළු ව්‍යාපාර කටයුතු සඳහා වසරක සහන කාලයකට යටත්ව වසර 10 ක ණය ආපසු ගෙවීමේ පදනම මත උපරිමය රු. 250,000 ක් දක්වා වූ ණය මුදලක් ලබා ගැනීමට හැකි වේ.

අදියර II යටතේ සියයට 4 ක පොළී අනුපාතයක් යටතේ ප්‍රතිලාභීන් සඳහා ණය ලබා දෙන අතර රජය විසින් සියයට 8 ක පොළී සහනාධාරයක් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ගෙවනු ලබයි.

# 3. පරිපාලන හා මූල්‍ය කාර්යසාධනය

## 3.1 පරිපාලන අංශය

අධ්‍යක්ෂ ජනරාල්ගේ මඟ පෙන්වීම යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව, 31 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයකින් සමන් විත වේ. එකී කාර්ය මණ්ඩලය මාණ්ඩලික නිලධාරීන් 12 දෙනෙකු හා සෙසු නිලධාරීන් 19 දෙනෙකුගෙන් සමන් විත වේ. 2016 වසර අවසන් වන විට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 37 ක් වන අතර එයින් තවදුරටත් පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව හයකි. දෙපාර්තමේන්තුවේ පරිපාලන, මූල්‍ය හා මානව සම්පත් සංවර්ධනයට අදාළ 2016 වසරේ තොරතුරු පහත පරිදි වේ.

### 3.1.1 කාර්ය මණ්ඩලය

**වගුව 3.1 : 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අනුමත කාර්ය මණ්ඩලය**

| | තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | මෙහෙයුම් කාර්ය මණ්ඩලය |
|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 |
| 02 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 01 | 00 |
| 03 | අධ්‍යක්ෂ | 04 | 04 |
| 03 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ | 06 | 06 |
| 04 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ - මූල්‍ය | 01 | 01 |
| 05 | සැලසුම් සහකාර | 01 | 01 |
| 06 | පර්යේෂණ සහකාර | 02 | 01 |
| 07 | තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සහකාර | 01 | 01 |
| 08 | කළමනාකරණ සහකාර | 08 | 06 |
| 09 | රියදුරු | 07 | 06 |
| 10 | කාර්යාල කාර්ය සහායක | 05 | 04 |
| ***එකතුව*** | | **37** | **31** |

**2016 වසර තුළ දෙපාර්තමේන්තුවට සම්බන්ධ වූ නිලධාරීන්**

1. කේ.ජී.පී. පුෂ්පකුමාර මයා - අධ්‍යක්ෂ
2. ඩබ්.පී.එස්. වික්‍රමගේ මයා - සහකාර අධ්‍යක්ෂ
3. ඩී.එල්.වී. විජේරත්න මෙය - සහකාර අධ්‍යක්ෂ
4. එස්.ජේ.ඒ.කේ.ඩී. රණසිංහ මයා - කළමනාකරණ සහකාර
5. කේ.එස්.ඒ. ප්‍රියන්ත මයා - රියදුරු
6. ජේ.එම්.ඒ.පී. ජයකොඩි මයා - රියදුරු
7. ඩී.ඒ.එස්. කනගරත්න මයා - රියදුරු

**2016 වසර තුළ ස්ථාන මාරු ලබා ඉවත්ව ගිය නිලධාරීන්**

1. ඕ.එම්. ජාබීර් මයා - අධ්‍යක්ෂ
2. එස්.එස්.එච්.ඩබ්.කේ. සෙනෙවිරත්න මයා- කළමනාකරණ සහකාර
3. කේ.ඩී.ඩී. ගුණසේකර මයා - රියදුරු
4. පී.එච්.සී.එස්.ඩී. සිල්වා මයා - රියදුරු
5. ඩබ්.ඩී.ඒ. වික්‍රමසිංහ මයා - රියදුරු
6. කේ.එස්.ඒ. ප්‍රියන්ත මයා - රියදුරු

## 3.1.2 කාර්ය මණ්ඩල තොරතුරු

**වගුව 3.2 : දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු**

| නම | තනතුර | සම්බන්ධ කළ හැකි තොරතුරු | | |
|---|---|---|---|---|
| | | දුරකථන | ෆැක්ස් | විද්‍යුත් තැපැල |
| ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මයා | අධ්‍යක්ෂ ජනරාල් | 2484542 | 2394908 | dgdf@dfd.treasury.gov.lk atapattu.ampmb@dfd.treasury.gov.lk |
| කේ.ජී.පී. පුෂ්පකුමාර මයා | අධ්‍යක්ෂ | 2484507 | 2484955 | kumara.kgpp@dfd.treasury.gov.lk |
| එම්.කේ.ඩී.එන්. මාදම්පෙ මිය | අධ්‍යක්ෂ | 2484605 | 2484955 | madampe.mkdn@dfd.treasury.gov.lk |
| පී.එම්.කේ. හෙට්ටිආරච්චි මයා | අධ්‍යක්ෂ | 2484572 | 2484955 | hettiarachchi.pmk@dfd.treasury.gov.lk |
| එච්.එස්.වී. කුමාර මයා | අධ්‍යක්ෂ | 2484595 | 2484955 | kumara.hsv@dfd.treasury.gov.lk |
| ඩබ්ලිව්.එල්.එම්.ඒ. ලියනගේ මිය | සහකාර අධ්‍යක්ෂ - මූල්‍ය | 2484596 | 2484955 | liyanage.wlma@dfd.treasury.gov.lk manorigl@yahoo.com |
| ආර්.ඒ.ඩී.ආර්. රණසිංහ මෙය | සහකාර අධ්‍යක්ෂ | 2484596 | 2484955 | ranasinghe.radr@dfd.treasury.gov.lk radranitha@gmail.com |
| ජේ.ඩී. කොටින්කඩුව මෙය | සහකාර අධ්‍යක්ෂ | 2484854 | 2484955 | kotinkaduwa.jd@dfd.treasury.gov.lk dilruksiko@gmail.com |
| ඩබ්.පී.එස්. වික්‍රමගේ මයා | සහකාර අධ්‍යක්ෂ | 2151494 | 2484955 | wickramage.wps@dfd.treasury.gov.lk |
| දිලුම් ඩබ්. කුමාරගුරු මෙය | සහකාර අධ්‍යක්ෂ | 2484501 | 2484955 | kumaraguru.dw@dfd.treasury.gov.lk |
| එන්.ඒ.කේ. සමරනායක මිය | සහකාර අධ්‍යක්ෂ | 2484501 | 2484955 | samaranayaka.nak@dfd.treasury.gov.lk |
| ඩී.එල්.වී. විජේරත්න මෙය | සහකාර අධ්‍යක්ෂ | 2337527 | 2484955 | wijeratna.dlv@dfd.treasury.gov.lk |
| එච්.පී.එස්. ශාන්ත මහතා | සැලසුම් සහකාර | 2484884 | 2484955 | shantha.hps@dfd.treasury.gov.lk |

| නම | තනතුර | සම්බන්ධ කළ හැකි තොරතුරු | | |
|---|---|---|---|---|
| | | දුරකථන | ෆැක්ස් | විද්‍යුත් තැපැල |
| ඒ.එම්. වික්‍රමසිංහ මෙය | පර්යේෂණ සහකාර | 2484884 | 2484955 | wickremasinghe.am@dfd.treasury.gov.lk |
| ජේ.එම්.අයි.ඒ. ගීෂානි මෙය | තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සහකාර | 2484884 | 2484955 | geeshani.jmia@dfd.treasury.gov.lk |
| ටී. හේවාවසම් මිය | කළමනාකරණ සහකාර | 2484862 | 2484955 | hewawasam.t@dfd.treasury.gov.lk |
| එච්.ඒ.ඩී.ඒ. නිලන්ති මිය | කළමනාකරණ සහකාර | 2484862 | 2484955 | nilanthi.hada@dfd.treasury.gov.lk |
| ආර්.කේ. ලෙනෝරා මයා | කළමනාකරණ සහකාර | 2484862 | 2484955 | lenora.rk@dfd.treasury.gov.lk |
| බී.ඒ.කේ.එස්.පී ජයවීර මිය | කළමනාකරණ සහකාර | 2484862 | 2484955 | jayaweera.baksp@dfd.treasury.gov.lk |
| ඩී.පී. සඳුනිකා මෙය | කළමනාකරණ සහකාර | 2484862 | 2484955 | sandunika.dp@dfd.treasury.gov.lk |
| එස්.ජේ.ඒ.කේ.ඩී. රණසිංහ මයා | කළමනාකරණ සහකාර | 2484862 | 2484955 | ranasinghe.sjakd@dfd.treasury.gov.lk |
| එම්.එන්.එල්. ප්‍රේමතිලක මයා | රියදුරු | 2484855 | 2484955 | - |
| එම්.පී. ගුණවර්ධන මයා | රියදුරු | 2484855 | 2484955 | - |
| එස්.ඒ. කීර්තිසේන මයා | රියදුරු | 2484855 | 2484955 | - |
| ජේ.එම්.ඒ.පී. ජයකොඩි මයා | රියදුරු | 2484862 | 2484955 | - |
| ඩී.ඒ.එස්. කනගරත්න මයා | රියදුරු | 2484862 | 2484955 | - |
| ආර්.එම්. කුලතුංග මයා | කාර්යාල කාර්යය සහායක | 2484855 | 2484955 | - |
| ජේ.එම්.ඩී.ජේ.එස්. හේමන්ත මයා | කාර්යාල කාර්යය සහායක | 2484855 | 2484955 | - |
| එම්.ආර්. ජයසිංහ මයා | කාර්යාල කාර්යය සහායක | 2484855 | 2484955 | - |
| ඩී.ඊ.කේ. පැලවත්තගේ මයා | කාර්යාල කාර්යය සහායක | 2484855 | 2484955 | - |

### 3.1.3 දේශීය පුහුණු පාඨමාලා, අධ්‍යයන චාරිකා හා සම්මන්ත්‍රණ

**වගුව 3.4 : දේශීය පුහුණු පාඨමාලා, අධ්‍යයන චාරිකා හා සම්මන්ත්‍රණ**

| නිලධාරියාගේ නම | පාඨමාලාවෙහි නම | පාඨමාලා කාලය | පැවැත් වූ ආයතනයෙහි නම |
|---|---|---|---|
| ආර්.ඒ.ඩී.ආර්. රණසිංහ මෙය සහකාර අධ්‍යක්ෂ | මුල්‍ය වෙළඳපොල පිළිබඳ හැඳින්වීම | 2016.05.13 | මිලෝදා ආයතනය |
| ඩබ්.පී.එස්. වික්‍රමගේ මයා සහකාර අධ්‍යක්ෂ | ග්‍රාමීය ප්‍රදේශවල අඩු ආදායම්ලාභී පවුල් කාන්තාවන් හරහා ශක්තිමත් කිරීමේ වැඩසටහන | 2016.12.14-2016.12.16 | කොරියානු ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය |
| එච්.ඒ.ඩී.ඒ. නිලන්ති මිය කළමනාකරණ සහකාර | රාජ්‍ය අංශයේ මුල්‍ය රෙගුලාසි | 2016.11.21-2016.11.22 | මිලෝදා ආයතනය |
| | වින්ඩෝස් පදනම් කර ගත් යෙදුම් පැකේජය | 2016.11.28-2016.11.30 | මිලෝදා ආයතනය |
| | කාර්ය මණ්ඩල කළමනාකරණය | 2016.12.21 | මිලෝදා ආයතනය |
| ඩී.පී. සඳුනිකා මෙය කළමනාකරණ සහකාර | රාජ්‍ය අංශයේ මුල්‍ය රෙගුලාසි | 2016.11.21-2016.11.22 | මිලෝදා ආයතනය |
| | වත්කම් කළමනාකරණය | 2016.12.22-2016.12.23 | මිලෝදා ආයතනය |
| එස්.ජේ.ඒ.කේ.ඩී. රණසිංහ මයා කළමනාකරණ සහකාර | රාජ්‍ය අංශයේ මුල්‍ය රෙගුලාසි | 2016.11.21-2016.11.22 | මිලෝදා ආයතනය |
| | අභ්‍යන්තර විගණනය | 2016.1.26 | මිලෝදා ආයතනය |
| ජේ.එම්.ඩී.ජේ.එස්. හේමන්ත මයා කාර්යාල කාර්ය සහායක | කාර්යාල සහායකයින්ගේ භූමිකාවන් හා වගකීම් | 2016.06.16-2016.06.17 | ජාතික කම්කරු අධ්‍යයන ආයතනය |

මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

### 3.1.4 විදේශීය පුහුණු පාඨමාලා, අධ්‍යයන චාරිකා හා සම්මන්ත්‍රණ

**වගුව 3.5 : විදේශීය පුහුණු පාඨමාලා, අධ්‍යයන චාරිකා හා සම්මන්ත්‍රණ**

| නිලධාරියාගේ නම | පාඨමාලාවෙහි නම | පාඨමාලා කාලය | පැවැත්වූ රටෙහි නම |
|---|---|---|---|
| ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මයා අධ්‍යක්ෂ ජනරාල් | එළවළු හා පළතුරු සඳහා ශීත ගබඩා පහසුකම් ඇති කිරීම අධ්‍යනය කිරීමේ දූත මණ්ඩල නියෝජනය | 2016.03.02-2016.03.05 | තායිලන්තය |
| | | 2016.03.06-2016.03.13 | ඊශ්‍රායලය |
| ඕ.එම්. ජාබීර් මයා අධ්‍යක්ෂ | ආසියානු හා පැසිපික් කලාපයේ රාජ්‍ය ප්‍රසම්පාදන ජාලය | 2016.10.10-2016.10.11 | දකුණු කොරියාව |
| | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායේ සංවර්ධනය සඳහා ක්ෂුද්‍රමූල්‍ය | 2016.04.25-2016.05.06 | චීනය |
| ඩබ්ලිව්.එල්.එම්.ඒ. ලියනගේ මිය සහකාර අධ්‍යක්ෂ - මූල්‍ය | සාර්ව ආර්ථික ප්‍රතිපත්ති | 2016.07.11-2016.07.18 | හොංකොං |
| ජේ.ඩී. කොටින්කඩුව මෙය සහකාර අධ්‍යක්ෂ | සාර්ව ආර්ථික ප්‍රතිපත්ති | 2016.07.30-2016.08.06 | හොංකොං |
| දිලුම් ඩබ්. කුමාරගුරු මෙය සහකාර අධ්‍යක්ෂ | සාර්ව ආර්ථික ප්‍රතිපත්ති | 2016.07.11-2016.07.18 | හොංකොං |
| එන්.ඒ.කේ. සමරනායක මිය සහකාර අධ්‍යක්ෂ | සාර්ව ආර්ථික ප්‍රතිපත්ති | 2016.07.30-2016.08.06 | හොංකොං |
| ඩී.එල්.වී. විජේරත්න මෙය සහකාර අධ්‍යක්ෂ | නැගී එන ආසියාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා ගෝලීය චීන වටිනාකම් අනුකලනය | 2016.11.02-2016.11.03 | චීනය |
| ජේ.එම්.අයි.ඒ. ගීෂානි මෙය තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන සහකාර | තොරතුරු තාක්ෂණය හා සන්නිවේදනය පිළිබඳ පශ්චාත් උපාධිය | 2015.08.10-2016.12.21 | දකුණු කොරියාව |

මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

## 3.2 මූල්‍ය අංශය


දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගැනීම සඳහා පුනරාවර්තන වියදම් ලෙස රු. 7,256,703,110 ක ප්‍රතිපාදනයක් ද ප්‍රාග්ධන වියදම් සඳහා රු. 2,313,918,004 ක ප්‍රතිපාදන ද වශයෙන් රු. 9,570,621,114 ක මුළු ප්‍රතිපාදන මුදලක් 2016 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු මඟින් වැය ශීර්ෂ 243 වැඩසටහන 01 හා වැඩසටහන 02 යටතේ වෙන්කර තිබුණි. වසර තුළ මුළු සත්‍ය වියදම රු. 9,158,236,090 ක් වූ අතර සත්‍ය පුනරාවර්තන වියදම හා ප්‍රාග්ධන වියදම පිළිවෙලින් රු. 6,869,851,545 ක් හා රු. 2,288,384,544 ක් විය. එකී වර්ෂය තුළ එම වියදම බෙදී ගිය ආකාරයත්, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ විස්තරත් පිළිවෙලින් පහත වගු අංක 3.6 සහ 3.7 මඟින් පෙන්නුම් කෙරේ.

**වගුව 3.6 : අයවැය ඇස්තමේන්තු උපයෝජනය - 2016**

| වැය විෂය | ඇස්තමේන්තුව (රු.) | සත්‍ය වියදම (රු.) |
|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | **7,256,703,110** | **6,869,851,545** |
| පුද්ගල පඩිනඩි | 21,200,000 | 21,026,447 |
| ගමන් වියදම් | 1,850,000 | 1,651,878 |
| සැපයීම් | 3,032,000 | 2,149,482 |
| නඩත්තු වියදම් | 2,006,500 | 1,442,508 |
| සේවා | 2,600,000 | 2,243,792 |
| සංවර්ධන සහනාධාර (පොළී සහනාධාර) | 7,225,554,610 | 6,840,948,438 |
| වෙනත් මාරු කිරීම් | 460,000 | 389,000 |
| **ප්‍රාග්ධන වියදම්** | **2,313,918,004** | **2,288,384,544** |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම. | 1,633,000 | 1,245,629 |
| කුසලතා වර්ධනය | 300,000 | 258,890 |
| වෙනත් ප්‍රාග්ධන වියදම් | 800,000 | 542,821 |
| සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත නඟා සිටුවීම උදෙසා පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය/ලෝක බැංකුව) | 1,000,000 | 675,620 |
| කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය වැඩි දියුණු කිරීම (ශ්‍රී ලංකා රජය/ජර්මන් රජය) | 224,000,000 | 219,002,073 |
| ගෝලීය ආහාර අර්බුදයට ප්‍රතිචාර දැක්වීමේ වැඩසටහන (ශ්‍රී ලංකා රජය/ලෝක බැංකුව) | 1,825,872,500 | 1,825,805,771 |
| රජයේ ධාන්‍ය ගබඩා සංකීර්ණ ත්‍රිත්වය ඉඳි කිරීම | 260,312,504 | 240,853,740 |
| **මුළු එකතුව** | **9,570,621,114** | **9,158,236,090** |

මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

**රූප සටහන 3.1 : දෙපාර්තමේන්තුවේ අයවැය ඇස්තමේන්තු හා සත්‍ය වියදම**




**වගුව 3.7 : රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුම - 2016**

| විස්තරය | අනුමත සීමාව (රු.) | සත්‍ය මුදල් වටිනාකම (රු.) |
|---|---:|---:|
| වියදම් උපරිම සීමාව | 2,500,000 | 2,203,419 |
| ලැබීම්වල අවම සීමාව | 700,000 | 1,178,853 |
| හර ශේෂයේ උපරිම සීමාව | 10,000,000 | 5,282,915 |

මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

## 3.3 විගණන විමසුම්

විගණකාධිපති දෙපාර්තමේන්තුව හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද සියළුම විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දුන් අතර ඔවුන් විසින් පෙන්වා දෙන ලද දුර්වලතා මඟ හරවා ගැනීමට ද අවශ්‍ය පියවර ගන්නා ලදී.

**වගුව 3.9 : විගණන විමසුම් - විගණකාධිපති දෙපාර්තමේන්තුව - 2016**

| # | ලද දිනය | විෂය | විගණකාධිපති දෙපාර්තමේන්තුවට පිළිතුරු යැවූ දිනය |
|---|---|---|---|
| 1 | 2016.02.17 | ගුදම් කුවිතාන්සි මූල්‍යකරණ ව්‍යාපෘතිය | 2016.03.01 |
| 2 | 2016.05.02 | විසර්ජන ගිණුම - 2015 | 2016.05.08 |
| 3 | 2016.06.07 | 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වාර්ෂය සඳහා ගුදම් කුවිතාන්සි මූල්‍යකරණ ව්‍යාපෘතිය පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව | 2016.06.20 |
| 4 | 2016.08.29 | කාර්යසාධන වාර්තාව | 2016.09.01 |
| 5 | 2016.10.25 | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම | 2016.11.02 |
| 6 | 2016.11.03 | 2015 වර්ෂයේ විගණකාධිපති වාර්තාව | 2016.11.08 |

මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

**වගුව 3.8 : විගණන විමසුම් - කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව - 2016**

| # | ලද දිනය | විෂය | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට පිළිතුරු යැවූ දිනය |
|---|---|---|---|
| 1 | 2016.03.14 | කළමනාකරණ විගණන වාර්තාව - 2015 හතරවන කාර්තුව | 2016.03.28 |
| 2 | 2016.05.05 | කළමනාකරණ විගණන වාර්තාව - 2016 පළමු කාර්තුව | 2016.05.17 |
| 3 | 2016.07.27 | කළමනාකරණ විගණන වාර්තාව - 2016 දෙවන කාර්තුව | 2016.08.03 |
| 4 | 2016.10.21 | කළමනාකරණ විගණන වාර්තාව - 2016 තුන්වන කාර්තුව | 2016.11.01 |

මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව